ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

NAOSL

වාර්තාවේ අංකය : ENV/2024/01
அறிக்கை இல. : ENV/2024/01
Report No. : ENV/2024/01

ශ්‍රී ලංකාවේ ජාතික උද්‍යාන වල තෘණ භූමි සංරක්ෂණ ක්‍රියාවලිය ඇගයීම පිළිබඳ පාරිසරික විගණන වාර්තාව

இலங்கையின் தேசிய பூங்காக்களிலுள்ள மேய்ச்சல் நிலங்களை பேணிப்பாதுகாக்கும் நடைமுறையினை மதிப்பீடு செய்தல் தொடர்பான சுற்றாடல் கணக்காய்வு அறிக்கை

Environmental Audit Report on Evaluation of Grassland Conservation Process in National Parks of Sri Lanka

පරිසර විගණන අංශය
சுற்றாடல் கணக்காய்வுப் பிரிவு
Environment Audit Division

ශ්‍රී ලංකාවේ ජාතික උද්‍යාන වල තෘණ භූමි සංරක්ෂණ ක්‍රියාවලිය ඇගයීම පිළිබඳ පාරිසරික විගණන වාර්තාව

වාර්තා අංකය: PER/B/2021/02

ජාතික විගණන කාර්යාලය

පරිසර විගණන අංශය

පටුන

පිටු අංකය

1.	විධායක සාරාංශය	01
2.	වාර්තාවේ පසුබිම හා ස්වභාවය	03
2.1	පසුබිම	03
2.2.	විගණනය සඳහා අධිකාරී බලය	18
2.3.	විගණන අරමුණ	18
2.4.	විගණනය සඳහා ප්‍රවේශය	18
2.5.	විගණන විෂය පථය සහ විෂය පථය සීමා වීම	18
2.6.	විගණන ක්‍රමවේදය	20
2.7.	විගණන නිර්ණායක	20
3.	විගණන නිරීක්ෂණ	24
3.1	ආයතනික පසුබිම	24
3.2.	තෘණ භූමි සංරක්ෂණය	25
3.3.	ආක්‍රමණික ශාකවල බලපෑම	29
3.4.	අනවසර පදිංචි වීම් හා අනවසර වගා කිරීම්	35
3.5.	අනෙකුත් සාධක	41
3.6.	තෘණ භූමි කළමනාකරණය සහ සංරක්ෂණය සඳහා වූ මූල්‍ය ප්‍රතිපාදන	55
4.	නිර්දේශ	62
5.	දෙමළ පරිවර්තනය	63-137
6.	ඉංග්‍රීසි පරිවර්තනය	139-193

1. විධායක සාරාංශය

වන සත්ත්ව හා වෘක්ෂලතා ආඥා පනත (469 වන අධිකාරිය) යටතේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් පාලනය කරන ජාතික උද්‍යාන ශ්‍රී ලංකාවේ ආරක්ෂා කළ යුතු වන සම්පත් වන අතර පරිසරයේ තුලනාත්මක බව රැක ගැනීමට හා වනජීවීන්ගේ පැවැත්ම උදෙසා මෙම කලාප මගින් මහත් පිටුවහලක් ලබා දේ. මෙම ජාතික උද්‍යාන වල පවතින තෘණ භූමි ඉහළ පාරිසරික වැදගත්කමකින් යුක්ත වන අතර තෘණ භක්ෂක සතුන් විශාල ප්‍රමාණයක් සඳහා වාසභූමියක් වීම, ජෛව විවිධත්වයෙන් යුක්ත වීම, පැළෑටි හා සතුන්ගේ තුලනාත්මකභාවය පවත්වාගෙන යෑම, පාංශු ගුණත්වය ආරක්ෂා කිරීම, ශාක වැස්මක් නැති විවෘත භූමි ප්‍රදේශ වල අලංකාරව විහිදී පැවතීම මගින් සොබාදහමට ආකර්ෂණීය සුන්දරත්වයක් එක් කිරීම, තෘණ භූමි ආශ්‍රිතව වාසය කරන වන අලින්, මුවන්, ගෝනුන් වැනි සතුන් නැරඹීමට විශාල සංචාරකයින් ප්‍රමාණයක් පැමිණීම, සංචාරක ආකර්ෂණය දිනා ගැනීම මගින් රටට විශාල ආදායමක් රැස් කර ගත හැකි වීම සහ එමගින් ආර්ථිකය සංවර්ධනය වීම වැනි ප්‍රයෝජන රාශියක් ජාතික උද්‍යාන සතු මෙම තෘණ භූමි මගින් සිදු වේ. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් දැනට ජාතික උද්‍යාන 26 ක් ප්‍රකාශයට පත්කර තිබේ. මෙම උද්‍යාන වල පැවැත්ම පිළිබඳ මෑත කාලයේදී පැන නැගී ඇති ගැටළු හේතුවෙන් මේවායේ පැවැත්ම අභියෝගයට ලක්ව ඇත. ඒ අනුව ඊට වගකිව යුතු රාජ්‍ය ආයතන වල කාර්යභාරය ඇගයීම හා මෙම පරිසර පද්ධති තුළින් පරිසරයට ඇති කරන බලපෑම ඇගයීම පිණිස ජාතික උද්‍යාන 09 ක් සහ අභයභූමි 02 ක් සඳහා අවධානය යොමු කරන ලදී. ජාතික උද්‍යාන සතු මෙම තෘණ භූමි වල වැදගත්කම මෙතෙක් අවධානයට ලක්නොවීම නිසා තෘණ භූමි වල පැවැත්මට ඇතිවන්නා වූ තර්ජනයන්හී වර්ධනය වීමක් දක්නට ලැබුණි. පාරිසරික වශයෙන් ඉතා වැදගත් වූ මෙම තෘණ භූමි ප්‍රදේශ විනාශයට පත්වීමේ අවධානමක් පවතින හෙයින් තෘණ භූමි සංරක්ෂණය කිරීම සඳහා අදාල බල අධිකාරිය ඇති ආයතන මගින් සිය කාර්යය ඉටුවී ඇත්ද යන්න ඇගයීමත් පවතින ගැටලු සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමත් මෙම විගණනයේ අරමුණ විය.

තෘණ භූමි සංරක්ෂණය හා කළමනාකරණය සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්තියක් හා කළමනාකරණ සැලසුමක් නොතිබීම, ආගන්තුක ආක්‍රමණශීලී ශාක සීඝ්‍ර ලෙස පැතිරීම, තෘණ භූමි සංරක්ෂණයට ප්‍රමාණවත් අවධානයක් යොමු වී නොතිබීම, අනවසර වගා කිරීම් හා අනවසර පදිංචිවීම් පැවතීම, ගවයින් උද්‍යාන තුළට අනවසරයෙන් ඇතුළු කිරීම හා අනවසර ගවගාල් උද්‍යාන තුළ පවත්වාගෙන යාමෙන් තෘණභක්ෂිත සතුන්ගේ ආහාර අඩු වීම, නව ජල යෝජනා ව්‍යාපෘති සහ වාරිමාර්ග කටයුතු සඳහා ජලය මුදා හැරීමේදී වැව් ජලයෙන් පිරී තිබීම හේතුවෙන් ස්වභාවික තෘණ භූමි වල පැවැත්මට බාධා ඇතිවීම, නීති රීති පැවතියද ඒවා ක්‍රියාත්මක කිරීමේ ගැටලු පැවතීම, මායිම් ගැටලු පැවතීම, ප්‍රමාණවත් ලෙස ප්‍රතිපාදන නොලැබීම, ජීවීන්ගේ චර්යා රටා, පාරිසරික තත්ත්වයන් හා කෘෂිකර්මාන්තය යන අංශ තුලනාත්මකව පාලනය නොකිරීමෙන් තිරසර පරිසර කළමනාකරණය සිදු නොවීම, තෘණ භූමි වල තිරසර පැවැත්මට බාධා සිදුවීම, වැව් ප්‍රතිසංස්කරණය නොකිරීම්, වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් අභය භූමි ජාතික උද්‍යාන බවට ගැසට්

මගින් ප්‍රකාශයට පත් කර නොතිබීම,(කහල්ල පල්ලෙකැලේ, කලා වැව) ජාතික උද්‍යානවල පාරිසරික දත්ත පද්ධති නොමැති වීම, සංවර්ධන යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේදී පරිසරය හා සතුන් අතර ගැටීම් ඇති නොවන ආකාරයේ සැලසුම් සකස් නොකිරීම, සංචාරකයින්ගේ පැමිණීම 2019 වර්ෂයේ සිට අඩුවීමත් සමඟ ජාතික උද්‍යානවල ආදායම අඩුවීම, විගණනයට භාජනය වූ ජාතික උද්‍යාන සියල්ලෙහිම පවතින වැව් පද්ධතියන්ට හා අනෙකුත් තෘණ භූමි වල තෘණ වර්ධනයට ආක්‍රමණශීලී ශාක ව්‍යාප්තිය විශාල බාධාවක් වී තිබීම, ජාතික උද්‍යානය තුළ සිටින වන අලින් ප්‍රමුඛ ශාක භක්ෂක සතුන්ගේ ප්‍රධාන ආහාරය වූ තෘණ හිඟවීම නිසා අලිමිනිස් ගැටුම වර්ධනයට වී ඇති බව සහ වන අලින් විසින් වගාහානි සිදු කිරීම ආදිය මෙම විගණනයේ දී නිරීක්ෂණය කරන ලදී.

ඉහත නිරීක්ෂණ සම්බන්ධව ජාතික උද්‍යාන තුළ ඇති තෘණ භූමි මනාලෙස කළමනාකරණය කර සතුන්ට අඛණ්ඩව ආහාර සපයා ගැනීමට හැකි ලෙස සැලසුම් සකස් කිරීම, මෙම තෘණ භූමි සංරක්ෂණය සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම, නෛතික ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීම හා මූල්‍ය ප්‍රතිපාදන වෙන්කිරීම, කාර්යමණ්ඩල යෙදවීම හා අනෙකුත් මූලික පහසුකම් ප්‍රමාණවත්ව සැපයීම, ආගන්තුක ආක්‍රමණශීලී ජීවී විශේෂ පාලනය සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම, ගෘහාශ්‍රිත සතුන් තෘණ භූමි වලට ඇතුලු වීම් නීති මගින් පාලනය කිරීම, සංවර්ධන ව්‍යාපෘති මනාව සැලසුම් කිරීම හා සතුන් හා පරිසරය නොගැටෙන පරිදි කළමනාකරණය කිරීම, අලි මිනිස් ගැටුම පාලනය සඳහා කාලීන සැලසුම් සකස් කිරීම හා ජාතික උද්‍යාන කළමනාකරණය හා ප්‍රගතිය සමාලෝචනය සඳහා යාවත්කාලීන දත්ත පද්ධතියක් පවත්වාගෙන යාමට නිර්දේශ කෙරේ.

2. වාර්තාවේ පසුබිම හා ස්වභාවය

2.1. පසුබිම

2.1.1. ශ්‍රී ලංකාවේ පවතින තෘණ භූමි පිළිබඳ හැඳින්වීම

ශ්‍රී ලංකාවේ වර්ග කිලෝ මීටර් 65,610 ක් පමණ වූ භූමි ප්‍රමාණයෙන් වර්ග කිලෝ මීටර් 12,000 ක් (සියයට 18) ක් පමණ ප්‍රදේශයක විසිරී පවතින තණ බිම් දක්නට ඇත. ශාක වැස්මක් නැති බිම් ප්‍රදේශවල පස සංරක්ෂණයෙහිලා මේවා මහත් සේවයක් ඉටු කරයි. මෙම තෘණ භූමි තෙත් කඳුකරයේ දක්නට ලැබෙන තෙත් පතන, වියලි කඳුකරයේ දක්නට ලැබෙන වියලි පතන, වියලි කලාපයේ දක්නට ලැබෙන දමන, සැවානා සහ විල්ලු වශයෙන් කාණ්ඩ කර ඇත.

ශ්‍රී ලංකාවේ පවතින තෘණ භූමි පහත ආකාරයෙන් වර්ග කර දැක්විය හැකිවේ.

(I) තෙත් පතන බිම්

උස මීටර් 2,000 කට ඉහල ප්‍රමුඛ නිවර්තන කඳුකර වනාන්තර පවතින ප්‍රදේශවල මෙම තෙත් පතන් බිම් දක්නට ඇත. තෙත් පතන් බිම් හෙක්ටයාර 5,500 ක් පමණ ප්‍රමාණයක විසිරී පවතින අතර ඒවා හෝටන්තැන්න, එල්ක් තැන්න, මාන් තැන්න, සීතා එළිය, බගවන්තලාව හා බෝපත්තලාව යන ප්‍රදේශවල ව්‍යාප්ත වී ඇත.

මනාව ව්‍යාප්ත වූ අධික වර්ෂාපතනය සහිත තෙත් පතන, මුළු වර්ෂය තුළදීම තෙත් සහ වගුරු සහිත වේ. තෘණ විශේෂ පඳුරු සහිත වන අතර සිහින් රළු දෘඩ ස්වභාවයක් ගනී. වියලි පතන පෙදෙස් වල මෙන් නොව මෙම තෙත් පතන් වල තනි තනිව වැඩෙන ගස්ද ඇත. මේ ගස් වලින් වැඩි ප්‍රමාණයක් මහරත්මල් (*Rhododendron Zeylancium*) විශේෂයේ ගස් වේ. එම ගස් වල කඳන් කුරුව ඇඹරුණු ස්වභාවයක් ගන්නා අතර එහි ප්‍රධාන කඳ සහ අතු ඉතා ඝනව වැඩෙන ලයිකනයෙන් වැසී තිබේ. තෙත් පතන බිම් වලට ලාක්ෂණික වූ තෘණ විශේෂ වන *Chrysopogon Zeylanieus* සහ *Chrysopogon* සමඟ වැඩෙන වෙනත් තෘණ වනුයේ *Arudinella, Pollinia, Ischacmum* සහ *Themeda* ය. වියලි පතන වල මෙන් නොව තෘණ හැර ආකාශ්ය ශාක කිහිපයක්ද මෙහි ඇත. සාමාන්‍යයෙන් වියලි පෙදෙස් වල වැඩෙන පර්ණාංගයක් වන *Pteridium aquilinum* ද මෙහි දක්නට ලැබේ.

(II) වියලි පතන බිම්

තෙත් පතනට වඩා විශාල ලෙස ව්‍යාප්ත වී ඇති වියලි පතන හෙක්ටයාර 75,000 ක් පමණ ප්‍රමාණයකින් යුක්ත වේ. වියලි පතන පිළිබඳ පැහැදිලි නිදසුන වැලිමඩ සානුවයි. මෙම සානුවේ විශාල පෙදෙසක ඇති වියලි පතන, මිටියාවත් වලත් කඳුවල පාදස්ථ බෑවුම් වලත් ඇති කුඩා වනාන්තර පෙදෙස්හි හැර සම්පූර්ණයෙන්ම වෘක්ෂ රහිත වේ. මෙවැනි තෘණ බිම් ඇති වෙනත් පෙදෙස් නකල්ස් කඳුකරයේත් දෙනියාය - රක්වාන කඳුකරයේත් දක්නට ලැබේ. මෙම පෙදෙස් වල රැලි බිම් සහ කවාකාර කඳු මුදුන් සහිතය. වියළි පතනට විශේෂ වූ තෘණ වර්ගය නම් පැගිරි

මානා (*Cymbopogon nardus*) ය. මෙම විශේෂය සමඟ ඇති සමගාමී තෘණ විශේෂය වනුයේ *Arudinella villosa, Pollinia* සහ *Ischaemum* ය. *Pteridiumaquailinum* නම් පර්ණාංගයද මෙහි දක්නට ලැබේ. තෙතමනය සහිත ගැඹුරු පස ඇති පෙදෙස්හි ද පහත් බෑවුම් වලද මේ තෘණ වර්ග සරු ලෙස වැඩේ.

තේ වගාව ඇරඹුන කාලයේදී වියළි පතනේ බොහෝ පෙදෙස්ද ඒ සඳහා යොදා ගන්නා ලදී. වර්ෂ 1930 ගණන් වල සිට මෙම පළාත්වල වන රෝපණ ව්‍යාපෘති ක්‍රියාත්මක විය. සමහර පෙදෙස්හි තේ වතු අත්හැර දමන ලද බිම්වල, පතන නැවත පැන නැගී ඇත.

(III) **පහතරට තණ බිම්**

පහතරට දක්නට ලැබෙන තණ බිම් ඒවා අයත්වන දේශගුණික කලාපය අනුව තලාව හා දමන ලෙස වෙන් කර ගත හැකිය. තලාව යන පදය පහතරට තෙත් ප්‍රදේශවල ඇති තණ බිම් වලට ව්‍යවහාර වන අතර වියලි කලාපයේ තණ බිම් දමන ලෙස හැඳින්වේ. මේ දෙකම හේන් ගොවිතැන නිසා හට ගැනෙන බැවින් මේවාට පොදු සම්භවයක් ඇත. හේන් ගොවිතැන් කළ පසු පසේ සශ්‍රීක බව අඩුවීම නිසාත් අතහැර දැමූ බිම්වල නිතර ඇති වන ගිණි නිසාත් නැවත වනාන්තර බිහිවීමේ ක්‍රියාවලිය අඩාල වීමෙන් තෘණ භූමියක් බවට පත් වේ.

(IV) **තලාව**

තලාව තණ බිම් කළුතර, ගාල්ල සහ මාතර දිස්ත්‍රික්ක වල දක්නට ලැබේ. මේවායේ ඇත්තේ ලැටරයිට් පසකි. බොහෝ විට පාංශු ඛාදනය හේතුවෙන් උඩුපස සේදී ගොස් ඇති නිසා පස බොරළු සහිත ඉතා නිසරු තත්ත්වයක පවතී. තලාව ප්‍රදේශවල වැවෙන තෘණ විශේෂ සමහරක් නම් Chrysopogon sp., Cynodon dactylon, Ischaemum rugosum, Themeda tremula සහ Cymbopogon nardus ය. පඳුරු සහ ආකාශ්ඨීය විශේෂද මෙහි ඇති අතර ඒවා වැඩි වශයෙන්ම දක්නට ලැබෙන්නේ වසර කිහිපයක්ම ගින්නෙන් බේරී ඇති භූමි වලය. ඇත්ත වශයෙන්ම මෙම පඳුරු හා ආකාශ්ඨීය පැළෑටි ශාක සංතථියක ප්‍රාරම්භය අඟවන අතර එවැනි පඳුරු සමහරක් නම් හීන් බෝවිටියා (*Osbekia aspera*), වැරණිය (*Hedyotis fruiticosa*), *Sysygium spp.*, බට (*Ochlandra stridula*) *සහ* කැකිල්ල (*Dicranopteris linearis*) ය. කෘමි භක්ෂක ශාකයක් වන බාඳුරා (*Nepenthes sp.*) සමහර ස්ථාන වල වැඩේ.

(V) **දමන තණ බිම්**

තලාව තණ බිම් කලාපයේ නොයෙකුත් තැන්වල දක්නට ලැබෙන අතර විශාල වශයෙන් නැගෙනහිර පළාතේ දක්නට ලැබේ. (උදාහරණ :- දිගාමඩුල්ල හා මඩකලපුව) ප්‍රමුඛ තෘණ විශේෂය ඉලුක් (*Imperata cylindrica*) ය. ඊට අමතරව *Cymbopogon nardus* සහ *Chrysopogon aciculatus* ආදිය දැකගත හැක. මේ තණබිම් වල *Cynodon dactylon, Echinocloa, Eragrostis*

tenella, Sporobolus diandrus යනාදි විශේෂ බහුලව දක්නට ලැබේ. තවද, අස්වැන්න, කරල් හැබ, වරා, රණවරා, හාතාවාරිය, උඳුපියලිය හා ආක්‍රමණික ශාක විශේෂයක් ලෙස හඳුනාගත් ගඳපාන වර්ගයක් ද මෙම තණබිම්වල දැකිය හැකිය. මෙම කලාපයේ වනාන්තර ප්‍රජාව ලෙස ඇති වියලි මිශ්‍ර සදාහරිත වනාන්තර හා සසඳන විට, දමන තණ බිමේ පසේ කාබන් හා නයිට්‍රජන් සාන්ද්‍රණය මදක් අඩුය. මැග්නීසියම්/ කැල්සියම් අනුපාතය වැඩිය.

(VI) **විල්ලු තණ බිම්**

අතහැර දමන ලද පැරණි වැව්, විශාල විල් සහ ගං ඉවුරු වැනි නිරතුරුවම තෙතමනය සහිත පෙදෙස්වල විල්ලු සහිත තණ බිම් දක්නට ලැබේ. හියුමස් බහුල පස සරුය. පසේ කාබන් නයිට්‍රජන් පොස්පරස් හා පොටෑසියම් සාන්ද්‍රණය වැඩිය. වියලි කාලයේදී පවා පසේ තෙතමනය පවතී. මෙම තණ බිම් ප්‍රජාවේ දක්නට ලැබෙන ස්ථායීතාවයට හේතුව ලෙස සැලකිය හැක්කේ මෙවැනි වාසස්ථානවල සඳහටම ඇති තෙතමනයයි. මාදුරු ඔය, පොළොන්නරුව, තමන්කඩුව, මනම්පිටිය වැනි මහවැලි ගංගා පිටාර තැන්නේ විශාල විල්ලු ඇත. මෙම පෙදෙස දිගටම තෙතමනය සහිත වන බැවින් වැවෙන තෘණ මාංසල, බිම දුවන, තෙතමනයට රුචි විශේෂ වේ. මෙහි ඇති විශේෂ සමහරක් නම් *Paspalidium, Cynodon* තෘණ සහ පන් විශේෂයක් වන *Fimbristyhs* වේ.

(VII) **සැවානා තණ බිම්**

සැවානා තණ බිම් උස් බිම් සැවානා සහ පහත් බිම් සැවානා වශයෙන් කොටස් දෙකකින් යුක්ත වේ. පහතරට සහ මැදරට අන්තර් කලාපයේද, වියලි කලාපයේද කොටස් ඇතුළුව මුහුදු මට්ටමින් මීටර් 100 – 500 දක්වා උස තරමක් විශාල ප්‍රදේශ වල මෙම සැවානා තණ බිම් විසිරී ඇත. මෙහි විශේෂ ලක්ෂණය නම් තණ බිම් සහ තැන තැන විසිරුණු වෘක්ෂලතායි. සාමාන්‍යයෙන් වියළි කලාපීය වනාන්තර වූ වියළි සදාහරිත වනාන්තර නිරතුරුව එළිපෙහෙලි කොට ගිනි තැබීමේ ප්‍රතිඵලයක් ලෙස සැවානා තණ බිම් හට ගත් බවට මතයක් ඇත. නිරතුරුවම ගින්නට ගොදුරු වීම නිසා බොහෝ ගස් විනාශ වී ගින්නට ඔරොත්තු දෙන ශාක සහ තෘණ වර්ග පමණක් මෙම පරිසරයෙහි ඉතිරි වී ඇත. තෘණ වලින් යුතු යටි රෝපණයකින්ම අතරින් පතර හුදකලාව වැඩෙන ගස් වලින්ද සැවානා වන ලැහැබ යුක්ත වේ. වෘක්ෂ විශේෂ වනුයේ අරළු, බුලු, නෙල්ලි, කහට, කුඩුම්බේරිය, ගම්මාලු සහ දාවු ය. මෙම ශාක විශේෂ සියල්ලක්ම ඖෂධීය ගුණයන් සහිත වීම විශේෂ ලක්ෂණයකි. බදුල්ල, බිබිල, ඇල්ල, වැල්ලවාය, නිල්ගල, ලුණු ගල, බලංගොඩ, ගල්ඔය වැනි ප්‍රදේශයන්හි මෙම වනාන්තර ආශ්‍රිත පරිසර පද්ධති දැකගත හැක.

උස්බිම් සැවානා ඌව සානුවේ වැඩි වශයෙන් දැකගත හැකිවේ. එහි සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය මිමි.1400-2000 අතර පවතී. එමෙන්ම ජූනි, අගෝස්තු සහ සැප්තැම්බර් මස මැද දක්වා වියලි කාලගුණයක් පවතී. නිතර ගිනිගැනීම සහ සෝදාපාළුවට ලක්වීම හේතුවෙන් පස නිසරු බවකින් යුක්ත වේ. සැවානා තණ බිම්වල තැන් තැන් වල ශේෂ වූ මීටර් 10ක් පමණ උසට වැඩුනු පඳුරු වලින් යුතු කැළෑ කුට්ටි හා තෘණ තලාවේ පැඟිරි හා මානා වැනි තෘණ විශේෂ දැකිය හැකි වේ.

වර්තමානයේ දී සැවානා තෘණ බිම් වල ගඳපාන වැනි (*Lantana camara* - ලන්ටානා) ආක්‍රමණශීලී පඳුරු විශේෂයන්ද බෝවිටියා, විශ්ණුක්‍රාන්ත, හීන් උඳුපියලිය, මහ උඳුපියලිය, ඇත්අඩි, ගිණිහිරිය වැනි ඖෂධ විශේෂයන්ද දැකිය හැක. මෙහි මුවන්, ඉත්තෑවන්, හාවුන් වැනි සතුන් වාසය කරන අතර දඩයම්කරුවන් මස් පිණිස සතුන් දඩයම් කිරීම සඳහා ද තෘණ බිම් ගිණි තැබීම කරනු ලබයි.

2.1.2. තෘණ භූමි ජෛව පද්ධතියේ වැදගත්කම

මෙම පද්ධතියේ වැදගත්කම පහත පරිදි සාරාංශ කර දැක්විය හැකිය.

(I) තෘණ භූමි ආශ්‍රිත පරිසර පද්ධතිය වන ජීවී විවිධත්වයෙන් යුක්ත වීම හා ජීවීන් රාශියකගේ මූලික වාසස්ථානයක් වේ.

(II) තෘණ භූමි විශාල ප්‍රමාණයේ ක්ෂීරපායී සතුන්ගේ පැවැත්මට අත්‍යාවශ්‍ය වන පරිසර පද්ධතියකි. (අලි, ඇතුන්, ගෝණුන්, මුවන් ආදී)

(III) තෘණ භූමි පරිසර පද්ධතිය තුළ පැළෑටි හා සතුන්ගේ තුලනාත්මකභාවයත් එහි පාංශු ගුණත්වයත් ආරක්ෂා කරගනු ලැබේ.

(IV) විවෘත භූමි ප්‍රදේශයක් තුළ අලංකාරව විහිදී ඇති තෘණ භූමි ආකර්ශණීය සුන්දරත්වයකින් යුක්ත වේ.

(V) පෘථිවියේ මුළු භූමි ප්‍රමාණයෙන් හතරෙන් එකකට ආසන්න ප්‍රමාණයක තෘණ භූමි පැතිරී පවතින අතර එය ලොව ඇති එක් විශාලතම ජෛව පද්ධතියක් වේ.

(VI) තෘණ භූමි මිනිසාට ඉතා ප්‍රයෝජනවත් පරිසර පද්ධතියක් වේ.

2.1.3. තෘණ භූමි සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් පවතින සීමාවීම්

පහත සඳහන් සීමා වීම් හඳුනාගත හැක.

(I) තෘණ භූමි කළමනාකරණය සඳහා ප්‍රමාණවත් නීති ප්‍රතිපාදන හා ප්‍රතිපත්තීන් නොමැති වීම.

(II) ජාතික පර්යේෂණ පද්ධතිය තුළ ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති වීම තුළ තෘණ භූමි සම්බන්ධ පර්යේෂණ කටයුතු සිදු කිරීමේ අපහසුතා පැවතීම.

(III) තෘණ භූමි ආශ්‍රිත ප්‍රදේශ වල යටිතල පහසුකම් ඉතා දුර්වල මට්ටමක පැවතීම.

(IV) තෘණ භූමි සම්බන්ධයෙන් ප්‍රමාණවත් වර්තමාන පර්යේෂණ තොරතුරු නොමැතිවීම.

(V) අධ්‍යාපනික වැදගත්කම පෘථුල ලෙස හඳුනාගෙන නොතිබීම.

(VI) වාර්ෂිකව වෙන්කල මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම.

2.1.4. දේශගුණික විපර්යාස තුළින් තෘණ භූමි වලට ඇතිවිය හැකි බලපෑම

දේශගුණික විපර්යාස මගින් තෘණ භූමි වල තිරසරභාවය සඳහා ඍජු බලපෑමක් එල්ලවිය හැක. ඉතා ඉහළ ජෛව විවිධත්වයකින් යුත් තෘණ භූමි තිරසර කළමනාකරණය තුළින් අවධානයට ලක්නොවීම තුළ අනාගතයේදී කාන්තාරකරණයට ලක්විය හැකි බව ලෝකයේ විවිධ පර්යේෂණ ප්‍රතිඵල තුළින් පුරෝකථනය කර ඇත.

තෘණ භූමි මගින් වනජීවී වාසස්ථාන, වැසිජල කළමනාකරණය, පාංශු සංරක්ෂණය, පාංශු කාබන් ගබඩාකරණය, ජලධර නැවත ආරෝපණය කිරීම, නියං කාල වලදී පාංශු ජල සංරක්ෂණය, පාංශු භෞතික හා රසායනික ගුණ වැඩිදියුණු කිරීම වැනි සේවාවන් සැපයෙන නමුත් දේශගුණික විපර්යාස මගින් මෙම සේවා තර්ජනයට ලක්විය හැක. දේශගුණ විපර්යාස තුළින් දීර්ඝ කාලීන නියං කාල ඇතිවන බව පුරෝකථනය කල හැක. එබැවින් එවැනි කාල වලදී ගිනිගැනීම් වලට ලක්වීමට වැඩි ප්‍රවණතාවයක් ඇති වේ. මෙම විපර්යාස වලට ඇතිවිය හැකි ප්‍රතිචාරයේ බලපෑම අවිනිශ්චිත වුවත් සැලකිලිමත් විය යුතු බව හඳුනා ගැනේ.

2.1.5. තෘණ භූමි සංරක්ෂණය හා තෘණ භූමි සංරක්ෂණ ක්‍රමවේදයන්

තෘණ භූමි සංරක්ෂණය යනු අපයෝජනයට ලක් වූ හෝ තර්ජනයට ලක් වූ තෘණ භූමි ආරක්ෂා කිරීමට හෝ දියුණු කිරීමට කටයුතු කිරීම වේ. එම ප්‍රදේශවලම ස්ථානගත වී අධීක්ෂණය කරමින් එම කටයුතු වලම නියැලීම අවශ්‍ය වේ.

එක්සත් ජාතීන්ගේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ස්වභාවික සම්පත් සංරක්ෂණ සේවාව මගින් තිරසර පැවැත්මක් සඳහා තෘණ භූමි සංරක්ෂණ ක්‍රියාපටිපාටීන් කිහිපයක් පහත පරිදි හඳුනාගෙන තිබුණි.

- ප්‍රවේශ පාලනය - Access Control
- යටි කැළය කළමනාකරණය කිරීම - Brush Management
- වැටවල් ස්ථාපිත කිරීම - Stabilizing Fence
- ආහාර අස්වැන්න කළමනාකරණය - Forage Harvest Management
- ශ්‍රේණි ස්ථායීකරණ ව්‍යුහයන් - Grade Stabilization Structure
- අධික ලෙස භාවිත ප්‍රදේශ ආරක්ෂණය - Heavy Use Protection Area
- පෝෂක කළමනාකරණය - Nutrient Management
- තණ බිම් හා පදුරු සිටවීම - Pasture and Hay Planting
- පළිබෝධ කළමනාකරණය - Pest Management
- නිර්දේශිත පිළිස්සීම - Prescribed Burning
- නිර්දේශිත තෘණ උලාකෑම් - Prescribed Grazing
- ගඟබඩ වන ස්වාරක්ෂකය - Riparian Forest Buffer
- වතුර ළිං - Water Well

- ජලය දැමීමේ පහසුකම - Watering Facility
- වනජීවී වාසස්ථාන කළමනාකරණය - Wildlife Habitat Management
- සුළං බාධක/ ආවරණ පටි ස්ථාපිත කිරීම - Wind Break/ Shelterbelt Establishment
- තණ බිම් තත්ත්ව ලකුණු - Pasture Condition Score
- ගිනිපටි ස්ථාපිත කර පවත්වා ගැනීම

2.1.6. තෘණ භූමි වැඩි වශයෙන් පවතින ශ්‍රී ලංකාවේ ජාතික උද්‍යාන

වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතේ (469 වන අධිකාරි) 2. (1) (ආ) වගන්තිය අනුව අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක මාර්ගයෙන්, රජයේ යම් නිශ්චිත භූමි ප්‍රදේශයක් මේ ආඥා පනතේ කාර්යයන් සඳහා ජාතික රක්ෂිත භූමියක් ලෙස ප්‍රකාශයට පත්කළ හැකි අතර ඒ නියමයේම මාර්ගයෙන් හෝ අනතුරුව ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක මාර්ගයෙන් එකී ජාතික රක්ෂිත භූමිය සම්පූර්ණයෙන්ම හෝ ඉන් යම් නිශ්චිත කොටසක් ජාතික උද්‍යානයක් ලෙස ප්‍රකාශයට පත් කළ හැකිය. එසේ ප්‍රකාශයට පත්කරන ලද ජාතික උද්‍යාන 26 ක් විගණිත දිනට පැවති අතර එමගින් වර්ග කිලෝමීටර 5,734 කට ආසන්න ප්‍රමාණයක් ආවරණය කරයි. මේ අතරින් තෘණ භූමි වැඩි වශයෙන් පවතින ජාතික උද්‍යාන කිහිපයක් පිළිබඳ තොරතුරු පහත පරිදිවේ.

(අ) හෝර්ටන් තැන්න

ඉතා ඉහල ජෛව විවිධත්වයක් ඇති වළාකුළු වනාන්තරයෙන් වැසුණු සුන්දර කඳු පන්තියකින් වට වූ උසින් වැඩිම උස් සම භූමිය වන්නේ හෝර්ටන් තැනිතලාවයි. ශ්‍රී ලංකාවේ ආණ්ඩුකාරවරයා ලෙස සේවය කල බ්‍රිතාන්‍ය ජාතික රොබට් හෝර්ටන් මහතා නමින් හෝර්ටන් තැන්න ලෙස නම් කර ඇති අතර 1969 දෙසැම්බර් මස 05 වන දින හෝර්ටන් තැන්න ස්වාභාවික රක්ෂිත භූමියක් ලෙසත් 1988 මාර්තු මස 16 වන දින ජාතික උද්‍යානයක් බවට පරිවර්තනය කරමින් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතට පත්කර තිබුණි. යුනෙස්කෝ සංවිධානයේ ලෝක උරුම සම්මුතිය විසින් හෝර්ටන් තැන්න ලෝක උරුමයක් ලෙස 2010 වර්ෂයේ අගෝස්තු මස 02 වන දින ප්‍රකාශයට පත්කර තිබුණි.

වාර්ෂික වර්ෂාපතනය මිලි මීටර 2500 පමණ වන අතර මුහුදු මට්ටමේ සිට මීටර් 1800-2300 අතර උසකින් හෝර්ටන් තැන්න පිහිටා ඇත. හෙක්ටයාර 3160 ක භූමි ප්‍රමාණයක විහිදී ඇති මෙම ජාතික උද්‍යානයේ උතුරු කොටසේ තොටුපල කන්ද හා එහි බටහිරින් කිරිගල්පොත්ත කන්ද පිහිටා ඇත. ලංකාවේ ප්‍රධාන ගංගා අතරින් වලවේ සහ කැළණි යන ගංගාවන්ද බගවන්තලා ඔය සහ අගාර ඔය ද ආරම්භ වන්නේ හෝර්ටන් තැන්නෙනි.

(i) හෝර්ටන් තැන්නට අයත් තෘණ භූමිය

වර්ගීකරණයට අනුව තෙත් පතන් තෘණ භූමි වර්ගයට අයත් හෝර්ටන් තැන්නේ මුළු භූමි ප්‍රමාණය හෙක්ටයාර 3,160 ක් වන අතර දළ වශයෙන් එයින් හෙක්ටයාර 500 කට වඩා වැඩි ප්‍රමාණයක් තෘණ භූමි ලෙසත් නැතහොත් මුළු භූමි ප්‍රමාණයෙන් 75% ක් වනාන්තර ලෙසත් 25% ක් තෘණ භූමි ලෙසත් වෙන්ව තිබේ. තෘණ භූමි ප්‍රමාණය හා වනාන්තර ප්‍රමාණය වෙන්ව මැනීම් කර හෙක්ටයාර ප්‍රමාණය වෙන්ව හඳුනාගෙන නොතිබුණි.මෙම භූමියේ උස් කඳුවල හා ඉහල බෑවුම්වල තෘණ භූමි දක්නට ලැබේ.මෙහි තෘණ වර්ග 03 දක්නට ලැබේ. එනම් මහ තුත්තිරි, ගවර හා හඳුනා නොගත් තෘණ වර්ගයක් ලෙසිනි.

හෝර්ටන් තැන්න ස්වාභාවික රක්ෂිතයක්, ජාතික උද්‍යානයක් හා ලෝක උරුමයක් ලෙස නම් කර ඇත්තේ මෙය වටිනා අති විශේෂ පරිසර පද්ධතියක් පරිපූර්ණ වූ නිසාවෙනි.

(A Nature guide to the world's end trail Horton Plains ග්‍රන්ථය ඇසුරෙනි)

(ii) තෘණ භූමියට අයත් පස

හෝර්ටන් තැන්නෙහි ඇති තෘණ භූමියට අයත් පස ස්ථර 04 කින් සමන්විත වන අතර ඉහලින්ම ඇති පස් ස්ථරය කළු පැහැයක් ගන්නා අතර ඊට හේතුව හියුමස් පස සහ මෙම තෘණ භූමි නිතර ගින්නට හසුවීම නිසා ඇති වූ කළු පැහැ වීම බලපා ඇත. මෙම තෘණ වල මුල් කළු පැහැ පස් ස්ථරය දක්වා පමණක් විහිදී ඇති අතර ඉන් පසුව ගල් සහිත පස් ස්ථරයක් ඊට යටින් කහ පැහැති පස් ස්ථරයක් හා අවසන් වශයෙන් රතු දුඹුරු පැහැති පස් ස්ථරයක් ඇත. මෙම තෘණ පඳුරු වල මුල් විහිදී ඇති නිසා පසේ තෙතමනය රඳා පවතින අතර පාංශු ඛාදනය ද වලක්වාලයි.

හෝර්ටන් තැනිතලාවේ කැපී පෙනෙන ලක්ෂණය වන්නේ වනාන්තරය හා තෘණ භූමි එක් නොවී වෙන්ව පිහිටා තිබීමයි. ඊට හේතුව ලෙස මෙම හියුමස් පස් තට්ටුව තෘණ භූමි වලට සීමා වන අතර වනාන්තරයට (Forest) ඇතුළුවීමට ඉඩ නොදීම බව වාර්තා කර ඇත.

(Pearson Report 1899- page 66)

(iii) හෝර්ටන් තෘණ භූමියට ආවේණික ශාක වර්ග

ඉහල ජෛව විවිධත්වයක් ඇති මෙම භූමියේ ශ්‍රී ලංකාවට ආවේණික ශාක විශාල සංඛ්‍යාවක් දක්නට ලැබෙන අතර ඉන් තෘණ භූමි වලට ආවේණික වූ ශාක කිහිපයක් පහත දැක්වේ.

- මහරත් මල (*Rhododendron Arboreum*)
- සුදු බිනර (*Exacun Walkeri*)
- වල් වෙනිවැල්
- වැල් කපුරු (*Gaultheria Rudis*)
- කෙකටිය (*Aponogeton Jacobsenii*)
- වල් රෝස
- කොක්මොට (*Eriocaulon S.P*)
- හයසින්ත් ඕකිඩ් (*Satyrium Nepalense*)
- හීන් බෝවිටියා (*Osveckia Wightiana*)
- කුඩා සඳුන් (*Anathalis S.P*)
- මහ සුදනා (*Anaphalis Brepifolius*)
- ගොටුකොල (Centela Asiatica)
- වල් එඩරු (*Bupleurum Wighti*)
- ෆොගෙට්මීනොට් (*Cynogiossun Furcatun*)
- පැඟිරිමාන (*Cymvopogon Nardus*)
- සීතා පේර (*Rhodomyrtus Tomemtosa*)
- කැකිල්ල (*Dicranopteris Linearis*)
- කිඩාරම් (*Arisaema Leschenaultii)*

(iv) හෝර්ටන් තැන්නේ ඇති තෘණ වර්ග

මෙම තැනිතලා බිම්වලින් විශාල ප්‍රමාණයක් අතීතයේදී අර්තාපල් වගාව සඳහා යොදා ගෙන තිබූ අතර පසුව පරිසර සංරක්ෂණය සඳහා මෙම වගාව නැවැත් වූ පසු 19 වන ශතවර්ෂයේ පමණ මධ්‍යම කඳුකරයේ පිහිටි පශු ගොවිපලවල් සඳහා අප්‍රිකාවෙන් ගෙන්වන ලද තෘණ වර්ග 03 ක් මෙම තෘණ භූමියේ දක්නට ලැබේ.

ගවර, තුත්තිරි සහ හඳුනා නොගත් තෘණ වර්ගයක් ලෙස දක්වා ඇත. (A Nature guide to the world's end trail Horton Plains, C.V.S.Gunethilake) සහ අත්පොත ඇසුරෙනි.

- *Garnotia Exaristata* – තුත්තිරි - තෘණ බිම් වල දියපහරවල් ආශ්‍රිතව බහුලව දැකගත හැක.
- *Chrysopogon Zeylanicus* – ගවර - උසින් වැඩෙන, තෘණ බිම්වල ප්‍රමුඛ තෘණ විශේෂයකි.
- හඳුනා නොගත් තෘණ වර්ගය

මෙම භූමියෙහි ජලාශ්‍රිතව වැවෙන කුරු උණ (*Sinarundinaria densifolia*) ශාකය මෙහි ඇති ජලපෝෂක ආරක්ෂා කිරීමට අගනා මෙහෙයක් ඉටු කරන අතර හෝර්ටන් තැන්නට පමණක් ආවේණික වූ ශාකයකි. ලංකාවේ ඇති කුඩාම උණ වර්ගය මෙම කුරු උණ වන අතර ගෝනුන් මෙහි ළපටි දල්ල කෑමට ඉතා ප්‍රිය කරයි.

(v) හෝර්ටන් තැන්නට ආවේණික සතුන්

හෝර්ටන් තැන්න ජාතික උද්‍යානයේදී විශාල සතුන් එතරම් දැකිය නොහැකි වුවත් ඉතා පෘෂ්ඨීමත්ව වැඩුණු ගෝනුන් රංචු, කොටියා, වලස් වඳුරා, වැලි මුවා, දඬු ලේනා, බළල් දිවියා, වල් ඌරා හා හාවා ආදී සතුන් දැකිය හැකි අතර ලංකාවට ආවේණික වූ අංකටුස්සා සහ කඳුකරයට පමණක් ආවේණික වූ වලස් වඳුරා වැදගත් ස්ථානයක් ගනී.

දේශීය කුරුලු වර්ග 02 ක් සහ සංක්‍රමණික කුරුලු වර්ග 11 ක් පමණ මෙම උද්‍යානයේ දැකිය හැකි බවත් ආවේණික පක්ෂීන් අතරින් ලංකා පිතකන් කොණ්ඩයා, ලංකා සිතැසියා, ලංකා අරංගයා සහ අඳුරු නිල්මැසිමාරා සුවිශේෂී වන බව වාර්තා වන අතර වඳ වී යන පක්ෂි විශේෂ 34 න් 17 ක් මෙම ජාතික උද්‍යානයේ දැකිය හැකිය. මෙම ජාතික උද්‍යානය මෙරට සමනලයින් සඳහාද ඉතා සුදුසු ස්වාභාවික වාසස්ථානයකි. පයිස් බුෂ්වැට් පක්ෂියා තෘණ පඳුරු වල කූඩු සාදන පක්ෂියෙක් වන අතර ලේ මැඩිල්ලා යන නිර්විෂ සර්ප විශේෂයද මෙම තෘණ භූමියට ආවේණික වූ සර්පයෙකි.

(vi) හෝර්ටන් තැන්නේ සුන්දරත්වය වැඩි කරන ගෝනුන්

හෝර්ටන් තැන්නේ සුන්දරත්වය හා පැවැත්ම සමඟ බැඳී පවතින සංචාරක ආකර්ෂණය දිනාගත් සත්ව කොට්ඨාශයක් වන ගෝනුන් මෙම තෘණ භූමියේ පැවැත්ම උදෙසා ආරක්ෂා කර ගැනිම ඉතා වැදගත් වන අතර ගෝනුන්ගේ පැවැත්ම උදෙසා මෙම තෘණ භූමිය මනාව කළමනාකරණය කල යුතුය. මෙම ජාතික උද්‍යානයේ වාර්ෂික ආදායම දළ වශයෙන් ලක්ෂ 400 ක් පමණ වන අතර එය වනජීවී දෙපාර්තමේන්තුවේ කටයුතු සඳහා ඉහළ දායකත්වයක් ලබා දෙන්නක් බැවින් මෙම ජාතික උද්‍යානය මනා කළමනාකාරිත්වයකින් පවත්වාගෙන යාම රජයේ සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වගකීම වේ.

(ආ) මින්නේරිය ජාතික උද්‍යානය

1997 අගෝස්තු මස 12 වන දින ගැසට් අංක 988/4 මගින් මින්නේරිය ජාතික උද්‍යානය ප්‍රකාශයට පත්කර තිබුණි. උතුරු මැද පළාතේ පොළොන්නරුව දිස්ත්‍රික්කයට අයත් හෙක්ටයාර් 8,889 කින් යුත් මෙම ජාතික උද්‍යානය වන අලින් විශාල ප්‍රමාණයක් එකවර නැරඹිය හැකි ස්වභාවික සුන්දරත්වයෙන් අනූන වූ ජාතික උද්‍යානයක් ලෙස ප්‍රකට වේ.

i. මින්නේරිය ජාතික උද්‍යානයේ වෙසෙන ශාක භක්ෂක සතුන් සහ තෘණ භූමි ප්‍රමාණය

මින්නේරිය ජාතික උද්‍යානයේ තෘණ ආහාරයට ගන්නා සතුන් වර්ග සහ සතුන් සංඛ්‍යාව දළ වශයෙන් පහත දක්වා ඇති අතර අලින්, මුවන්, ගෝනුන්, හාවුන්, ගෘහාශ්‍රිත ගවයන් ,එළ ගවයන් සහ මී ගවයන් මේ අතර වේ.

වගු අංක - 01 මින්නේරිය ජාතික උද්‍යානයේ තෘණ ආහාරයට ගන්නා සතුන් වර්ග

තෘණ ආහාරයට ගන්නා සතුන් වර්ග	සතුන් සංඛ්‍යාව (දළ වශයෙන්)
අලි	500 – 750 අතර ප්‍රමාණයක්
මුවන්	1000 ට වැඩි
ගෝනුන්	400 ට වැඩි
හාවුන්	1000 ට වැඩි
මී ගවයන්/ එළ ගවයන්	500 – 750 අතර ප්‍රමාණයක්

(උද්‍යාන භාරකරු මගින් ලබාගත් දත්ත)

ඉහත සටහන අනුව මින්නේරිය ජාතික උද්‍යානය තුළ ජීවත් වන ප්‍රධාන ආහාරය ලෙස තෘණ ආහාරයට ගන්නා සතුන් සංඛ්‍යාව ඉතා විශාල වන අතර මුළු භූමි ප්‍රමාණය හෙක්ටයාර් 8,889 වෙන් තෘණ භූමි වලට අයත් ප්‍රදේශය දල වශයෙන් හෙක්ටයාර් 1,210 ක් පමණි. විස්තර පහත පරිදි වේ.

වගු අංක - 02 මින්නේරිය ජාතික උද්‍යානයේ තෘණභූමි ව්‍යාප්තිය

තෘණ පිහිටා ඇති ස්ථාන	**ප්‍රමාණය දළ වශයෙන් (හෙක්ටයාර්)**
මින්නේරිය වැව් පිටිය	1,000
මහ පිටිය	20
වේර පිටිය	10
උද්‍යාන මාර්ගය	100
උණ පිටිය	20
විදුලි රැහැන් මාර්ග	10
කුඩා තෘණ භූමි	50
	1,210

(උද්‍යාන භාරකරු මගින් ලබාගත් දත්ත)

(ඇ) කවුඩුල්ල ජාතික උද්‍යානය

උතුරු මැද පළාතට අයත් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පිහිටා ඇති කවුඩුල්ල ජාතික උද්‍යානය 2002 අප්‍රේල් 01 දිනැති හා අංක 1230/5 දරන ගැසට්පත්‍රය මගින් ජාතික උද්‍යානයක් ලෙස ප්‍රකාශයට පත් කර තිබුණි. හෙක්ටයාර් 6,656 පුරා පැතිරී යන මෙම ජාතික උද්‍යානය තුළ අලි රංචු හා ඔවුන්ගේ සුන්දර ක්‍රියාකාරකම් දැකගත හැක. මුවන්, ගොනුන් සහ විවිධ පක්ෂීන්ගෙන් ගහන ස්වාභාවික සෞන්දර්යයෙන් අනූන වූ ජාතික උද්‍යානයකි.

වගු අංක - 03 කවුඩුල්ල ජාතික උද්‍යානයේ වාසය කරන තෘණ ආහාරයට ගන්නා සතුන්

තෘණ ආහාරයට ගන්නා සතුන් වර්ග	**ප්‍රමාණය (දළ වශයෙන්)**
අලි	400 ට වැඩි
මුවන්	100 ට වැඩි
ගෝනුන්	100 ට වැඩි
වැලි මුවා	100 ට වැඩි
ගෘහාශ්‍රිත ගවයින්	1,500 පමණ

(උද්‍යාන භාරකරු මගින් ලබාගත් දත්ත)

වගු අංක - 04 කවුඩුල්ල ජාතික උද්‍යානයේ තෘණ භූමි ව්‍යාප්තිය

තෘණ භූමි පිහිටා ඇති ස්ථානය	ප්‍රමාණය දළ වශයෙන් (හෙක්ටයාර්)
ජලාශයේ වැව් පිටිය	1,000
උද්‍යානය තුළ	80
	1,080

(උද්‍යාන භාරකරු මගින් ලබාගත් දත්ත)

ඉහත සටහන් අනුව කවුඩුල්ල ජාතික උද්‍යානය තුළජීවත්වන තෘණ ආහාරයට ගන්නා සතුන් විශාල සංඛ්‍යාවක් සිටින අතර මුළු භූමි ප්‍රමාණය හෙක්ටයාර් 6,900න් තෘණ භූමි වලට අයත් වන්නේ හෙක්ටයාර් 1,080ක් පමණි. එනම් සියයට 16 කට ආසන්න ප්‍රමාණයකි.

(ඇ) කලාවැව ජාතික උද්‍යානය

කලාවැව ජාතික උද්‍යානය උතුරුමැද පළාතට අයත් අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති අතර 2015 වර්ෂයේ ඔක්තෝබර් මස 17 වන දින තිරසර සංවර්ධන හා වනජීවි අමාත්‍යවරයා විසින් විවෘත කළ බවට ජාතික උද්‍යානය තුළ පිහිටා ඇති පුවරුවක සටහන් කර තිබුණි.

දළ වශයෙන් හෙක්ටයාර් 5,044.97 ක ප්‍රමාණයක් පුරා විහිදී ඇති මෙම ජාතික උද්‍යානය සුවිශේෂ වන්නේ වියළි කාලයේ සංක්‍රමණය වන විශාල අලි ඇතුන් රංචු නිසාය. 2018 වර්ෂයේ අගෝස්තු මාසයේ වනජීවි නිලධාරින් විසින් සිදුකළ නිල නොලත් සංගණනය අනුව ඇත් රංචු 04 ක් සිටින බවත් එහි විශාල දළ ඇතුන් 22 ක් හා කුඩා දළ ඇතුන් 26 ක් සිටින බවට නිරීක්ෂණය කර තිබුණි. එමෙන්ම Tuskers of Kalawawa National Park නම් ග්‍රන්ථයේ කලාවැව ජාතික උද්‍යානයේ සිටින ඇතුන් 18 දෙනෙකුගේ ඡායාරූප ඇතුළත් කර තිබුණි. ලංකාවේ දළ ඇතුන් සිටින්නේ සියයට 7 ක් පමණ වන බවත් වැඩිම දළ ඇතුන් සංඛ්‍යාවක් වාසය කරන්නේ කලාවැව ජාතික උද්‍යානයේ වන බවටත් හඳුනාගෙන තිබුණි. අධික වියළි කාලයත් සමඟ ජලය සිඳීගොස් වැව් පිටියේ ලා තණකොළ මතුවන කාලයට මේවා ආහාරයට ගැනීමට ඇතුන් විශාල වශයෙන් රොක්වීම ඔවුන්ගේ ස්වභාවික සංචරණ රටාවේ අංගයක් වී තිබේ. අප්‍රේල් සිට අගෝස්තු කාලය තුළ අලි 150 - 350 ක් පමණ සිටින බවත් කලා වැව උද්‍යානය තුළ ස්ථිර වාසස්ථානය කරගෙන අලි 50-75 ක් පමණ සිටින බවත් කලා වැව අසල වන පද්ධතිය තුළ මෙම ඇතුන් එකිනෙකාට සමීපව සමූහයක් ලෙස සැරිසරන බවත් මොවුන් වියළි කාලයේ මෙන්ම ඇතැම් විට වසර පුරා මෙම වනාන්තරය තුළ සැරිසරන බවත්

නිරික්ෂණය කොට ඇත. වැසි කාලය උදාවත්වම සංක්‍රමණය වන ඇතුන් මෙම භූමියෙන් ඉවත්ව යන අතර ස්ථිරව පදිංචිවී සිටින ඇතුන් මෙහිම රැදී සිටින බව වාර්තා විය. කලා වැව ජාතික උද්‍යානය රැකගත යුතු දළ ඇතුන් රාශියක් සිටින ඉතා සුන්දර පරිසරයක පිහිටා තිබෙන සංචාරක ආකර්ශණය ඉතා පහසුවෙන් ලබාගත හැකි වටිනා ජාතික උද්‍යානයක් මෙන්ම අලි ඇතුන්ගේ පාරාදීසයක් බවට ප්‍රකටව පවතී.

(ඉ) ලුණුගම්වෙහෙර ජාතික උද්‍යානය

1995 දෙසැම්බර් 08 වන දිනැති අංක 900/1 හා 2009 ජුලි 13 දිනැති අංක 1610/06 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත්කළ ලුණුගම්වෙහෙර ජාතික උද්‍යානයට ඌව පළාතේ මොණරාගල දිස්ත්‍රික්කයේ වැල්ලවාය, තණමල්විල, කතරගම සහ බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ සහ දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පිහිටි හෙක්ටයාර් 27,185.85 ක ප්‍රමාණයකින් සමන්විත ප්‍රදේශයක් අයත්වේ. අලීන්, මුවන්, හාවුන් සහ ගෝනුන් වැනි තෘණ භක්ෂක සතුන් 100 කට වැඩි ප්‍රමාණයක් වාසය කරන මෙම ජාතික උද්‍යානය සංචාරකයන් අතර ප්‍රසිද්ධව ඇත්තේ විශාල අලි සංඛ්‍යාවක් නැරඹිය හැකි ස්ථානයක් ලෙසිනි.

(ඊ) කුමන ජාතික උද්‍යානය

අම්පාර දිස්ත්‍රික්කයේ යාල නැගෙනහිර කොටසට අයත් කුමන ජාතික උද්‍යානය 2006 ජූනි 05 දින ප්‍රකාශයට පත්කර ඇති අතර භූමි ප්‍රමාණය හෙක්ටයාර් 35,664 ක් පුරා විහිදී යයි. කුමන ජාතික උද්‍යානය සංචාරක පක්ෂීන්ගේ පාරාදීසයක් ලෙස සංචාරකයින් අතර ප්‍රසිද්ධියට පත්ව තිබෙන අතර දළ වශයෙන් ශාක භක්ෂක සතුන් වන මුවන් 6,000 ක්, කුළු හරක් 2,500 ක්, අලි 50 ක් පමණ දළ වශයෙන් මෙම ජාතික උද්‍යානය තුළ වාසය කරන බව උද්‍යාන භාරකරු මගින් ලබාගත් දත්ත අනුව වාර්තා විය.

(උ) ලාහුගල ජාතික උද්‍යානය

නැගෙනහිර පළාතට අයත් අම්පාර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති මෙම ජාතික උද්‍යානය 2006 ජූලි 20 දින ලාහුගල ජාතික උද්‍යානය බවට පත්විය. භූමි ප්‍රමාණය හෙක්ටයාර් 5,131 කි. අලි ඇතුන්ගේ රාජධානියක් ලෙසින් හා ඔවුන් නැරඹීමට සුදුසු ස්ථානයක් ලෙසට මෙම උද්‍යානය ප්‍රසිද්ධියක් උසුලන අතර මෙම ජාතික උද්‍යානය තුළ වාසය කරන සතුන් අතරින් ශාක භක්ෂක සතුන් අලි 75-100, මුවන් 50-75, හාවුන් 75-100, ගෝනුන් 30-50 ත් අතර සංඛ්‍යාවක් දළ වශයෙන් වාසය කරන බව උද්‍යාන භාරකරු මගින් ලබාගත් දත්ත අනුව අනාවරණය විය.

(ඍ) හොරොව්පතාන ජාතික උද්‍යානය

උතුරු මැද පළාතේ පිහිටා ඇති 23 වන ජාතික උද්‍යානය හොරොව්පතාන ජාතික උද්‍යානයයි. වර්ග කිලෝමීටර් 2,570 ක ප්‍රමාණයක පිහිටා ඇති මෙම උද්‍යානය 2011 දෙසැම්බර් 06 දින ගැසට් අංක 1735/21 මගින් ජාතික උද්‍යානයක් වශයෙන් ප්‍රකාශයට පත්කර ඇත. 2015 වර්ෂයේදී ලංකාවේ ප්‍රථම අලි රැඳවුම් උද්‍යානය (EHG- Elephant Holding Ground) මෙම උද්‍යානයේ පිහිටුවන ලද අතර ධාරිතාවය අලි 40 කට ආසන්න ප්‍රමාණයක් විය. 2012 මාර්තු 17 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශ අංක 12/0151/549/001 මගින් ඉහත අවශ්‍යතාවය ඉල්ලුම් කර තිබූ අතර රු.මි. 345 ක වැය බරක් දරමින් ඉදිකළ අලි රැඳවුම් උද්‍යානය 2015 වර්ෂයේදී විවෘත කර ඇත.

(එ) විල්පත්තු ජාතික උද්‍යානය

ලංකාවේ පැරණිම වනජීවී රක්ෂිත අතරින් ඉතා වැදගත් ජාතික උද්‍යානයක් ලෙස විල්පත්තු ජාතික උද්‍යානය හඳුන්වනු ලබයි. මුල්ම ආර්ය සංක්‍රමණය සිදු වූ ස්ථානය ලෙස ප්‍රකට වන අතර ඉපැරණි ජනාවාසයන්ගේ නටබුන් තුළින් ඒ බව මනාව පිළිබිඹු වන බව වාර්තා වේ. ස්වාභාවිකව පිහිටි විල් සමූහයක් ඇති නිසා විල්පත්තුව යන නම නිර්මාණය වී ඇති අතර විහිදුණු පරාසයක මෙම විල් දැකගත හැකිවේ. විල්පත්තු ජාතික උද්‍යානය 1938 පෙබරවාරි 25 දින ජාතික උද්‍යානයක් ලෙස ප්‍රකාශයට පත් කර තිබුණු අතර හෙක්ටයාර 131,667.7 ක වපසරියකින් යුක්ත වේ.

අනුරාධපුර, පුත්තලම සහ මන්නාරම යන දිස්ත්‍රික්ක තුනටම විහිදෙන විල්පත්තු ජාතික උද්‍යානය ශ්‍රී ලංකාවේ විශාලතම ජාතික උද්‍යානය වේ. උද්‍යානයේ උතුරු ප්‍රදේශයට මායිම්ව මල්වතු ඔය හා මෝදරගම් ආරුද දකුණු ප්‍රදේශයට මායිම්ව කලා ඔය ද පිහිටා ඇත. තැනිතලා බිමකින් යුතු විල්පත්තු ජාතික උද්‍යානය වන සතුන්ගේ වාසය සඳහා අපූරු භූ තලයක් නිර්මාණය කර තිබේ. තණ බිම් පහත් බිම් සහ වනාන්තර, ඇළ, දොළ, විල්, වැව්, පොකුණු ආශ්‍රිත ජලජ පරිසරයක් සහිත මෙම ජාතික උද්‍යානය දුටුවන්ගේ නෙත් සිත් වසඟයට පත්කරවන මනස්කාන්ත පරිසරයකට හිමිකම් කියයි.

(ඒ) අම්පාර අභය භූමිය

අම්පාර අභය භූමිය 1954 වර්ෂයේ පෙබරවාරි 12 දින ගැසට් අංක 10,640 මගින් අභය භූමියක් ලෙස ප්‍රකාශයට පත් කර තිබුණි.

(ඕ) බුද්ධංගල අභය භූමිය

බුද්ධංගල අභය භූමිය 1974 වර්ෂයේ නොවැම්බර් මස 01 දින ගැසට් අංක 136 මගින් අභය භූමියක් ලෙස ප්‍රකාශයට පත් කර තිබුණි.

මාදුරු ඔය හා ගල් ඔය ජලාශ හරහා අලි මංකඩවල් මගින් වන අලින් අම්පාර හා බුද්ධංගල අභය භූමිවලට සංක්‍රමණය කරන අතර අම්පාර අභය භූමිය හරහා බුද්ධංගල අභය භූමියට ඔවුන්ගේ ස්වභාවික සංක්‍රමණ රටාව අනුව සංක්‍රමණය කරන අතර මෙම අභයභූමි දෙකම අලින්ගේ තාවකාලික ලැගුම්පලවල් වේ. එම කාල සීමාවේ අලි 180 ක් පමණ සංඛ්‍යාවක් මෙම අභය භූමිය තුළ රැඳී සිටින බව අනාවරණය විය.

2.2. විගණන සඳහා අධිකාරී බලය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ (154) (1) ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ ඇතුළත් විධි විධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

2.3. විගණන අරමුණ

2.3.1. විගණන අරමුණ

ශ්‍රී ලංකාවේ ජාතික උද්‍යාන තුළ තෘණ භූමි ආරක්ෂාව සහ වැඩි දියුණු කිරීම සඳහා රාජ්‍ය අංශයේ දායකත්වය ඇගයීම.

2.3.2. විගණන උප අරමුණු

i. නෛතිකමය පසුබිම පරීක්ෂාව
ii. භෞතික හා මූල්‍ය ප්‍රතිපාදන වල ප්‍රමාණවත්භාවය ඇගයීම
iii. වර්තමානයේ මුහුණදෙන තර්ජන හා ඒ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග ඇගයීම

2.4. විගණනය සඳහා ප්‍රවේශය

(අ) ශ්‍රී ලංකාවේ ජාතික උද්‍යාන තුළපිහිටි තෘණ භූමිවල වැදගත්කම හේතුවෙන් ඒ කෙරෙහි ඇති වී ඇති තර්ජන අවබෝධ කර ගැනීම හා ඒ පිළිබඳව අවධානය යොමු කිරීමේ වැදගත්කම අවධාරණය කිරීම.

(ආ) ශ්‍රී ලංකාවේ ජාතික උද්‍යානවල පවතින තෘණ භූමිවල පැවැත්ම උදෙසා පවතින තර්ජන ක්‍රමිකව වර්ධනය වීම හා ඒ පිළිබඳ වැඩි අවධානයක් යොමු නොකිරීම හේතුවෙන් ඇති වී තිබෙන පාරිසරික ගැටළු, ආනුශාංගික ගැටළු හා ඒ සඳහා පදනම්වන හඳුනාගත් හේතු සාකච්ඡා කිරීම මෙම විගණනයේ මූලික පදනම විය.

2.5. විගණන විෂය පථය හා විෂය පථය සීමා වීම

2.5.1. ජාත්‍යන්තර ප්‍රමිතිවලට අනුකූල වීම

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 5110 – ISSAI 5140) අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී.

2.5.2. විෂය පථය

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ශ්‍රී ලංකාවේ තෘණ භූමි ආරක්ෂාව සහ වැඩි දියුණු කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග පරීක්ෂාවේදී වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කර ඇති ජාතික උද්‍යාන 26 ක් අතුරින් හෝර්ටන් තැන්න, මින්නේරිය, කවුඩුල්ල, කලා වැව, ලුණුගම්වෙහෙර, කුමන, ලාහුගල, හොරොව්පතාන, විල්පත්තු යන ජාතික උද්‍යානයන්හි සහ බුද්ධංගල හා අම්පාර යන අභය භූමි වල ස්වභාවික තෘණ භූමි සහිත ස්ථාන සම්බන්ධව වර්තමාන තත්ත්වය හා එවායේ සංරක්ෂණය සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග පරීක්ෂා කිරීම සිදු කරනු ලැබේ. තවද ශ්‍රී ලංකාවේ ජාතික උද්‍යානවල තෘණ භූමි සංරක්ෂණ ක්‍රියාවලිය පිළිබඳ නෛතිකමය පසුබිම පරීක්ෂාව, භෞතික හා මූල්‍ය ප්‍රතිපාදන වල ප්‍රමාණවත්භාවය ඇගයීම හා වර්තමානයේ මුහුණදෙන තර්ජන හා ඒ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග ඇගයීම පිළිබඳව ද පරීක්ෂාවට ලක්කරන ලදී.

2.5.3. විෂය පථය සීමා වීම

(අ) මෙම වාර්තාවේ ඇතුලත් කරුණු තහවුරු කර ගැනීම සඳහා අදාළ පාර්ශව විසින් තොරතුරු ලබා ගැනීම සඳහා කටයුතු කිරීමේදී ඊට යහපත් ප්‍රතිචාර නොදැක් වූ අවස්ථා පැවතීම.

(ආ) 2020 වර්ෂයේ පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් ස්ථානීය පරීක්ෂණ සීමිත සංඛ්‍යාවක් පමණ ඉටුකිරීමට සිදුවීම.

(ඇ) 2022 වර්ෂයේදී රට තුළ පැවති ඉන්ධන අර්බුදය හේතුවෙන් භෞතික පරීක්ෂණ කටයුතු සීමා කිරීමට සිදු වීම.

(ඈ) යාවත්කාලීන දත්ත වල පවතින හිඟකම (වර්තමානයේ සත්‍ය වශයෙන් පවතින හෙක්ටයාර් ප්‍රමාණය සම්බන්ධ මිණුම් ඇතුළු වෙනත් දත්ත)

2.6. විගණන ක්‍රමවේදය

පහත සඳහන් ක්‍රමවේද ඔස්සේ සාක්ෂිමය කරුණු රැස්කරන ලදී.

(i) ලේඛනගත දත්ත

(ii) සමීක්ෂණ දත්ත

(iii) විග්‍රහාත්මක දත්ත

(iv) භෞතිකව පරීක්ෂාවෙන් ලබාගන්නා ලද තොරතුරු

(v) සම්මුඛ සාකච්ඡා

(vi) ප්‍රශ්ණාවලි ලබා දීම

(vii) විශේෂඥ දැනුම හුවමාරුව

(viii) අන්තර්ජාතික විගණන වාර්තා පරික්ෂාව

2.6.1. සාක්ෂි වල ප්‍රභවය

පහත සඳහන් සාක්ෂි ප්‍රභවයන් යටතේ සාක්ෂි රැස් කරන ලදී.

(i) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමඟ සාකච්ඡා කිරීම සහ ඒ සම්බන්ධ ලිඛිත තොරතුරු ලබා ගැනීම.

(ii) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමඟ සාකච්ඡා කිරීම සහ ලිඛිත තොරතුරු ලබා ගැනීම.

(iii) ගැසට් නිවේදන

(iv) මාධ්‍ය මගින් (රූපවාහිනි, සඟරා, පුවත්පත්, පර්යේෂණ වාර්තා, පොත් හා අන්තර්ජාලය) තොරතුරු ලබා ගැනීම.

2.7. විගණන නිර්ණායක

2.7.1. නීති රෙගුලාසි හා අනපනත්

(i) 1964 අංක 44 සහ 1970 අංක 01 හා 1993 අංක 49 දරන පනත් වලින් සංශෝධිත වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත (469 වන අධිකාරිය)

(ii) 2009 අංක 22 දරන වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක(සංශෝධන) පනත

(iii) 1966 අංක 13 දරන පනතින් සංශෝධිත (451 වන අධිකාරය වන) වන අඥාපනත

(iv) 2009 අංක 65 දරන කැලෑ (සංශෝධිත) පනත

(v) 1951 අංක 25 දරන පස සංරක්ෂණ පිළිබඳ ආඥා පනත

(vi) ශ්‍රී ලංකාවේ ආගන්තුක ජීවී විශේෂ පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, උපායමාර්ග හා ක්‍රියාකාරී සැලැස්ම - 2016 ජුනි

(vii) ශ්‍රී ලංකාවේ ආක්‍රමණශීලී ආගන්තුක ජීවී විශේෂ හඳුනාගැනීමේ රූපමය මාර්ගෝපදේශකය

2.7.2. පර්යේෂණ වාර්තා

i. The National Red List of Sri Lanka; Conservation status of the fauna and flora. (Ministry of Environment and the National Botanic Gardens)

2.7.3. විවිධ අණපනත් යටතේ වූ නිර්ණායක

වගු අංක - 05 - විවිධ අණපනත් යටතේ වූ නිර්ණායක

පනතේ නම සහ වගන්තිය	විස්තරය
(අ) වන සත්ව හා වෘක්ෂලතා ආඥා පනත (469 වන අධිකාරිය)	6 වගන්තිය - ජාතික උද්‍යාන තුළ තහනම් ක්‍රියා
6 (ඉ) වගන්තිය	වගා කිරීම, පතල් හැරීම, හෝ අන් කිසි කාර්යයක් සඳහා යම් ඉඩමක් ශුද්ධ කිරීම හෝ හෑරීම
6 (ඊ) වගන්තිය	ගින්නක් පත්තු කිරීම හෝ ගෙනයාම
6 (උෟ) වගන්තිය	කැලෑවක් අළුතෙන් එළි කිරීම
6 (එ) වගන්තිය	යම් ස්ථිර හෝ තාවකාලික ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා හෝ එසේ ඉදිකෙරුණු ගොඩනැගිල්ලක පදිංචි වීම සඳහා නියමිත නිලධරයා විසින් නිකුත් කරනු ලැබූ අවසර පත්‍රයක බලය යටතේ විනා එසේ ගොඩනැගිල්ලක් ඉදි කිරීම හෝ එසේ ඉදිකල ගොඩනැඟිල්ලක පදිංචි වීම
2009 අංක 22 දරන වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක(සංශෝධන) පනත	
4.2අ (1) වගන්තිය	නියම කරනු ලැබිය හැකි යම් මාර්ගෝපදේශ මත පදනම්ව, යම් ජාතික රක්ෂිත භූමියක් සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පත්කරනු ලබන කළමනාකරණ සැලසුම් කමිටුවක් විසින් කළමනාකරණ සැලසුමක් පිළියෙල කරනු ලැබිය හැකිය.
(9) (5) වගන්තිය - ප්‍රදාන ප්‍රඥප්තියේ 6 (3) වගන්තිය සංශෝධනය	කිසිම තැනැත්තකු විසින් ගෘහාශ්‍රිත සතෙකු යම් ජාතික රක්ෂිත භූමියකට දක්වාගෙන යාම හෝ එබඳු සතකුට එවැනි භූමියක දඩාවතේ යෑමට ඉඩදීම නොකළ යුතුය.

(ආ) 1966 අංක 13 දරන පනතින් සංශෝධිත (451 වන අධිකාරය වන) වන අඥාපනත	
9 වන වගන්තිය සහ iii වන පර්ච්ඡේදය - ගම්බද වන - (ආ) (2) වගන්තිය	ගවයන්ට තණ කැවීම ආදිය සඳහා වූ අයිතිවාසිකම් ඇතැම් අවස්ථා වලදී අත්හිටුවීමට අමාත්‍යවරයාට ඇති බලය
14 වන වගන්තිය (ආ) (2)	උප වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් කඩ කරමින් ගවයින් තණ කැවීම නොකළ යුතුය.
iv වන පරිච්ඡේදය වන සහ වන ද්‍රව්‍ය ආරක්ෂා කිරීම 20(1)	රක්ෂිත වනයකට හෝ ගම්බද වනයකට ඇතුලත් නොවන වනයක් එහි තණ වගාව නොහොත් වන ද්‍රව්‍ය ප්‍රයෝජනයට ගැනීම අමාත්‍යවරයා විසින් සාදනු ලබන රීති වලට අනුකූලව මිස කිසිම තැනැත්තකු නොකළ යුතුය.
20(1) (3) (ඉ)	තණ කැපීම හා ගවයින් තණ කැවීම විධිමත් කිරීම හෝ තහනම් කිරීම සහ තණ කැවීමේදී සහ ඒ ගවයන් තණ කැවීමේ දී ගෙවිය යුතු ගාස්තු (ඇතොත්) විධිමත් කිරීම.
78 වගන්තිය	"වන ද්‍රව්‍ය" (ආ) තෘණ, වැල්, බට සහ පෙඳ ඇතුළු ගස් නොවන පැළෑටි වල සියුම් කොටස් හෝ ඉන් උපදින දෑ.
(ඇ) 2009 අංක 65 දරන කැලෑ (සංශෝධිත) පනත - සංරක්ෂණ වනයක තහනම් ක්‍රියා	
9 (6) (2) (ඇ) වගන්තිය	සංරක්ෂණ වනයක ගවයන්ට අයුතු ලෙස ඇතුළු වීමට ඉඩ දෙන හෝ තණ කොළ හෝ වෙන යම් පැලෑටියක් කපන නැතහෙත් ඒ තණ කොළ හෝ පැලෑටි ගවයන්ට කෑම සඳහා ලබා දෙන යම් තැනැත්තකු වරදකට වරදකරු වේ.
10 (7) (1) (ආ) වගන්තිය	රක්ෂිත වනයක ගවයන්ට අයුතු ලෙස ඇතුළු වීමට ඉඩ දෙන හෝ තණ කොළ හෝ වෙන යම් පැලෑටියක් කපන නැතහොත් තණකොළ හෝ පැලෑටි ගවයන්ට කෑමට දෙන තැනැත්තකු වරදකට වරදකරු වේ.

20 (1) (ඉ) වගන්තිය	සංරක්ෂණ වනයක්, රක්ෂිත වනයක් හෝ ගම්බද වනයක් හැර වෙනත් වනයක ගවයන්ට තණ කෑමට දෙන, දඩයම් කරන, වෙඩි තබන, මසුන් අල්ලන නැතහොත් උගුල්, පුඩු හෝ තුවක්කු අටවන තැනැත්තකු වරදකට වරදකරු වේ.
(ඇ) 1951 අංක 25 දරන පස සංරක්ෂණ පිළිබඳ ආඥා පනත	
(4) (ඉ) වගන්තිය	පස සෝදා යාම නැවැත්වීමේ හෝ සීමා කිරීමේ හෝ ඇල දොලවල උල්පත් ප්‍රදේශ හා ඉවුරු ආරක්ෂා කිරීමේ කාර්යය සඳහා එසේ කිරීම අවශ්‍ය වූ අවස්ථා වලදී වගා කිරීමේ හෝ තෘණ බිම් වැඩිවි කටයුතු සඳහා ඉඩම් යෙදවීම සීමා කිරීම.
(4) (ඊ) වගන්තිය	පස ආරක්ෂා කිරීම සහ ගිනි වලින් සිදුවන අන්තරාය හෝ එයින් සිදුවන අලාභ හානි අඩු කිරීම සඳහා කැලෑ සහ තණ බිම් ප්‍රදේශ හානිදායක ලෙස ප්‍රයෝජනයට ගැනීම තහනම් කිරීම හෝ සීමා කිරීම.
(6) (ඉ) වගන්තිය	ඉඩමක සතුන් තණ කෑමෙන් එම ඉඩම වගාවට බාධාවක් වේ නම් නැතහොත් එසේ කෑමෙන් පසෙහි සාරවත් භාවය අඩු කිරීමේ ප්‍රමාණයට හෝ නැතහොත් එයින් පස සෝදා යාමෙන් වන අලාභයට අනුබල ලැබේ නම් ප්‍රමාණයට පූර්වෝක්ත ඉඩමේ සතුන් තණ කෑම කිරීම.
(6) (උ) වගන්තිය	තණබිම් ගිනි තැබීම හා හේන් ගිනි තැබීමේදී ගිනි විහිද යෑම තහනම් කිරීම නැතහොත් සීමා කිරීම.

3. විගණන නිරීක්ෂණ

3.1. ආයතනික පසුබිම

3.1.1. ජාතික ප්‍රතිපත්තියක අවශ්‍යතාව

ශ්‍රී ලංකාවේ ජාතික උද්‍යාන වල තෘණ භූමි කළමනාකරණය සම්බන්ධයෙන් කළමනාකරණ සැලසුම් පාදක කරගත් ක්‍රියාවලියක් පමණක් පවතිනු ලබන අතර තෘණ භූමි කළමනාකරණය සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්තියක් හා ඒ මත පදනම් වූ උපායමාර්ගික සැලසුම් ක්‍රියාත්මක වීමක් නිරීක්ෂණය නොවුණි. ආයතනික කාර්යභාරය, අරමුණු, ආයතන අතර සම්බන්ධතාවය, ක්‍රියාකාරකම් යනාදිය නිශ්චිතව හඳුනාගැනීමට හැකි වුවත් ජාතික ප්‍රතිපත්තියක් නොමැති වීම නිසා එම කාර්යයන් අපේක්ෂිත පරිදි ඉටු වී නොතිබුණ බව නිරීක්ෂණය විය.

3.1.2. නීති රීති රෙගුලාසි

ශ්‍රී ලංකාවේ ජාතික උද්‍යාන වල තෘණ භූමි කළමනාකරණය සම්බන්ධයෙන් විධිමත්, කාලීන සහ සමස්ථය ආවරණය වන නීති පද්ධතියක අවශ්‍යතාවය විගණනයේදී අනාවරණය වුවද ඒ සම්බන්ධයෙන් මේ වන තෙක් නිසි අවධානය යොමු වී නොතිබුණි.

3.1.3. ජාතික උද්‍යාන වල තෘණ භූමි කළමනාකරණ සැලසුම්

(අ) ශ්‍රී ලංකාවේ ජාතික උද්‍යාන වල තෘණ භූමි කළමනාකරණය සඳහා 2009 අංක 22 දරන වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක(සංශෝධන) පනත අදාල වන අතර පනතේ 4.2.අ.(1) වගන්තිය මඟින් ජාතික රක්ෂිත භූමි සඳහා සහ අභයභූමි සඳහා කළමනාකරණ සැලැසුම් පිළියෙල කිරීමට අදාල ප්‍රතිපාදන දක්වා තිබුණද විගණනය සඳහා භාජනය වූ ජාතික උද්‍යාන අතුරින් හෝර්ටන්තැන්න, කවුඩුල්ල, මින්නේරිය සහ ලුණුගම්වෙහෙර යන ජාතික උද්‍යාන වල කළමනාකරණ සැලසුම් යාවත්කාලීන කර නොතිබුණි. තවද මෙම කළමනාකරණ සැලසුම් මගින් අදාල ජාතික උද්‍යාන වල තෘණ භූමි කළමනාකරණය සම්බන්ධයෙන් ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණ බව නිරීක්ෂණය විය.

(ආ) ආක්‍රමණශීලී ශාක පැතිරයාම පාලනය කිරීමට මනා ලෙස සකස් කල කළමනාකරණ සැලැස්මක් හා ඒ අනුව පිලියෙල වූ ක්‍රියාකාරී සැලැස්මක් අවශ්‍ය වන අතර ප්‍රමාණවත් මුදල් ප්‍රතිපාදන නිසි කාලයට ලබා දීම අත්‍යවශ්‍ය වුවද එසේ සිදු වී නොතිබුණ බව නිරීක්ෂණය විය.

(ඇ) ජාතික ජෛව විවිධත්ව උපායමාර්ගික ක්‍රියාකාරී සැලසුම 2016-2022 හි 2 වන ඉලක්කය යටතේ ආක්‍රමණශීලී ආගන්තුක ජීව විශේෂ මගින් එල්ලවන බලපෑම අඩුකිරීම හඳුනාගෙන ඇති අතර ඊට අදාල ක්‍රියාකාරී සැලසුමේ 11 වන ක්‍රියාකාරකම ලෙස හඳුනාගත් ආක්‍රමණශීලී ආගන්තුක ජීව විශේෂ සඳහා එම එක් එක් ජීව විශේෂ සඳහාම සුවිශේෂිත කළමනාකරණ සැලසුම් සැකසීම මේ වන විටත් ප්‍රමාණවත් ලෙස සිදු කර නොතිබුණ බව නිරීක්ෂණය විය.

3.2. තෘණ භූමි සංරක්ෂණය

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති කාර්යභාරය ලෙස තෘණ භූමි සංරක්ෂණ ක්‍රියාවලිය සම්බන්ධ නිරීක්ෂණ පහත පරිදි විය.

3.2.1. සංරක්ෂණය කළ යුතු තෘණ භූමි

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් විශේෂ අවධානයක් යොමු කොට සංරක්ෂණය කළ යුතු තෘණ භූමි ලෙස පහත ජාතික උද්‍යාන වලට අයත් තෘණ භූමි හඳුනාගෙන තිබුණි.

වගු අංක - 06 විශේෂ අවධානයක් යොමු කොට සංරක්ෂණය කළ යුතු තෘණ භූමි

අනු අංකය	තෘණ භූමිය අයත් ජාතික උද්‍යානයේ නම	ජාතික උද්‍යානයක් ලෙස ගැසට් පත්‍රය මගින් ප්‍රකාශිත දිනය
01	යාල	1938 පෙබරවාරි 25
02	ලුණුගම්වෙහෙර	1995 දෙසැම්බර් 08
03	බූන්දල	1993 ජනවාරි 04
04	උඩවලව	1972 ජූනි 30
05	කුමන	2006 ජූලි 05
06	මාදුරු ඔය	1983 නොවැම්බර් 09
07	ලාහුගල	2006 ජූලි 20
08	විල්පත්තුව	1938 පෙබරවාරි 25
09	හොරොව්පතාන	2011 දෙසැම්බර් 06
10	වස්ගමුව	1984 අගෝස්තු 07
11	කවුඩුල්ල	2002 අප්‍රේල් 01
12	හෝර්ටන්තැන්න	1988 මාර්තු 16

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් විශේෂ අවධානයක් යොමු කොට සංරක්ෂණය කළ යුතු තෘණ භූමි ලෙස හඳුනාගන්නා ලද මෙම ජාතික උද්‍යාන වල තෘණ භූමි සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. මීට අමතරව වික්ටෝරියා, රන්දෙණිගල, රන්ටැඹේ අභය භූමිය සහ රාවණා ඇල්ල යන අභය භූමි තුළ පිහිටි තෘණ භූමි සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කොට සංරක්ෂණය කළ යුතු තෘණ භූමි ලෙස හඳුනාගෙන තිබුණ ද මේවා සංරක්ෂණය කිරීම සම්බන්ධයෙන් විගණිත දින වන 2022 සැප්තැම්බර් 23 දින වන විටත් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

3.2.2. තෘණ භූමි වල පැවැත්ම සම්බන්ධයෙන් පවතින තර්ජන

වර්තමානයේදී තෘණ භූමි වල පැවැත්ම සම්බන්ධයෙන් පවතින තර්ජන ලෙස ආක්‍රමණශීලී ශාක වල සීඝ්‍ර ව්‍යාප්තිය, ගෘහාශ්‍රිත ගවයන් අනවසරයෙන් රක්ෂිත භූමි තුලට ඇතුලු කිරීම, නිතර ඇතිවන අධික වර්ෂාපතන හා නියං කාලයේදී සිදුවන ගිනිගැනීම් වැනි විවිධ කාලගුණ විපර්යාසයන් නිසා තෘණ භූමි නඩත්තුව අඛණ්ඩව සිදු කිරීමට බාධා ඇතිවීම යනාදිය හඳුනාගෙන තිබුණි. එසේ වුවද ආක්‍රමණශීලී ශාක වල සීඝ්‍ර ව්‍යාප්තිය, ගෘහාශ්‍රිත ගවයන් අනවසරයෙන් රක්ෂිත භූමි තුළට ඇතුලු කිරීම වැනි බාධා අවම කර ගැනීම සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ප්‍රමාණවත් පරිදි කටයුතු කර නොතිබුණු බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

3.2.3. තෘණ භූමි සංරක්ෂණය සම්බන්ධයෙන් ක්‍රියාත්මක ව්‍යාපෘති

2015 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලය තුළදී තෘණ භූමි හා රක්ෂිත ප්‍රදේශවල පවතින ආක්‍රමණශීලී ශාක ඉවත් කිරීම සම්බන්ධයෙන් පහත ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කර තිබුණි.

වගු අංක - 07 - තෘණ භූමි සංරක්ෂණය සම්බන්ධයෙන් ක්‍රියාත්මක ව්‍යාපෘති

වර්ෂය	ව්‍යාපෘතියේ නම	ව්‍යාපෘති කාලය
2018	උඩවලව ජාතික උද්‍යානයේ ආක්‍රමණශීලී ලන්ටානා ශාක ඉවත්කිරීමේ ව්‍යාපෘතිය	මාස 6
2018	තබ්බෝව අභයභූමියේ කලපු අන්දර ඉවත් කිරීමේ ව්‍යාපෘතිය	අවුරුදු 01
2018	බූන්දල ජාතික උද්‍යානයේ කලපු අන්දර සහ කටුපතොක් ඉවත් කිරීමේ ව්‍යාපෘතිය	අවුරුදු 01
2019	බූන්දල ජාතික උද්‍යානයේ ආක්‍රමණශීලී ශාක ඉවත් කිරීම	මාස 03
2019	උඩවලව ජාතික උද්‍යානයේ ආක්‍රමණශීලී ලන්ටානා ශාක ඉවත් කිරීමේ ව්‍යාපෘතිය	අවුරුදු 01
2020	බූන්දල ජාතික උද්‍යානයේ කලපු අන්දර ඉවත් කිරීමේ ව්‍යාපෘතිය	අවුරුදු 01
2020	තබ්බෝව අභයභූමියේ කලපු අන්දර ඉවත් කිරීමේ ව්‍යාපෘතිය	අවුරුදු 01

(අ) ආක්‍රමණශීලී ශාක ඉවත් කිරීමේ ව්‍යාපෘති අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සිදු කල යුතු වුවත් ඉහත ව්‍යාපෘතීන් කෙටි ව්‍යාපෘති කාලයකට සීමා වීම තුළ එම ව්‍යාපෘතීන් මගින් අපේක්ෂිත ආක්‍රමණශීලී ශාක ඉවත් කිරීමේ කාර්යය සාර්ථකව සිදු කර ගැනීමට නොහැකි වී ඇති බව භෞතික පරීක්ෂාවේදී ද නිරීක්ෂණය විය.

3.2.4. වනජීවී හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී සැලැස්ම යටතේ තෘණ භූමි සම්බන්ධයෙන් ක්‍රියාත්මක කර ඇති වැඩසටහන්

2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තු ක්‍රියාකාරී සැලැස්ම යටතේ තෘණ භූමි සම්බන්ධයෙන් ක්‍රියාත්මක කර ඇති වැඩසටහන් සඳහා දරා තිබූ වියදම පහත පරිදි විය.

වගු අංක - 08 - තෘණ භූමි සම්බන්ධයෙන් ක්‍රියාත්මක කර ඇති වැඩසටහන්

	2017	2018	2019	2020	2021
වපසරිය - හෙක්ටයාර්	987.5	415	187	272	662.39
වැඩසටහන් පිරිවැය (රු.)	4,145,342	2,050,580	1,940,044	8,123,617	26,988,288



රූප සටහන් - 01 - තෘණ භූමි සංරක්ෂණය සිදු කළ මුළු භූමි ප්‍රමාණය



රූප සටහන් - 02 - තෘණ භූමි සම්බන්ධයෙන් ක්‍රියාත්මක කර ඇති වැඩසටහන් පිරිවැය

(අ) පසුගිය වර්ෂ 05 තුළ තෘණ භූමි සංරක්ෂණය සිදුකල වපසරිය හා ඒ සඳහා දරන ලද වියදම පරීක්ෂාවේදී එම වියදම ක්‍රමයෙන් වර්ධනය වී තිබුණි. අදාල ක්‍රියාකාරකම් විද්‍යාත්මක පදනමකට අනුව අඛණ්ඩව සිදු කළ යුතු වුවත් විගණනයට භාජනය වූ ජාතික උද්‍යාන තුළ එසේ සිදු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

3.3. ආක්‍රමණික ශාකවල බලපෑම

ආක්‍රමණික ආගන්තුක ශාක විශේෂයක් යනු ශීඝ්‍රයෙන් වර්ධනය වීමේ සහ ප්‍රජනනය වීමේ හැකියාව අනුව සහ නව පරිසර පද්ධතිවලට ඉක්මනින් අනුවර්තනය වීමට හැකියාව සහ ප්‍රමාණාත්මකව ප්‍රදේශය තුළ ව්‍යාප්ත වීමේ හැකියාව මත වාසස්ථාන එකක් හෝ කිහිපයක් තුළ ව්‍යාප්තව ඇති දේශීය නොවන ශාක වේ. මෙවැනි ආක්‍රමණික ශාක විශේෂ තෘණ භූමිවල ජෛව විවිධත්වයට තෘණ භක්ෂක සතුන්ගේ ආහාරවලට, තෘණ භූමිවල සුන්දරත්වයට සහ සංචාරක ආකර්ෂණයට තර්ජනයක් වෙමින් පවතින සාධකයක් බව හඳුනාගෙන ඇත.

3.3.1 හෝර්ටන්තැන්න ජාතික උද්‍යානය

දළ වශයෙන් හෙක්ටයාර් 500 කට වඩා වැඩි වපසරියක විහිදී පවතින හෝර්ටන් තැන්න තෘණ භූමියේ පවතින ආක්‍රමණික ශාක වර්ගයක් ලෙස යුලෙක්ස් ශාකය (*Ulex Ecuropeus*) විගණිත දින වනවිට හඳුනාගෙන තිබුණි. යුලෙක්ස් ශාකය කටු සහිත කහ පැහැති කුඩා මල් ඇති ශාකයක් වන අතර මී මැස්සන් මගින් පරාගනය සිදු වේ.

මෙයට අමතරව ආක්‍රමණික ශාකයක් ලෙස වර්ගීකරණය කර නොතිබුණු මහරත්මල් ශාකය ද හෝර්ටන්තැන්න ජෛව විවිධත්වය තුළ කැපී පෙනෙන ශාක විශේෂයක් විය.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් සිදු කරන ලදී.

(අ) හෝර්ටන් තැන්නේ තෘණ භූමි ආක්‍රමණය කරමින් යුලෙක්ස් ශාකය (*Ulex Ecuropeus*) තෘණ භූමිය පුරා පැතිර යමින් පවතින බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. මේ හේතුවෙන් ලෝක උරුමයක් සේ සැලකෙන හෝර්ටන්තැන්න ජාතික උද්‍යානයේ තෘණ භූමි වලට පාරිසරික වශයෙන් විශාල හානියක් සිදු විය හැකි බව නිරීක්ෂණය විය. තවද 2009 වර්ෂයේ සිට යුලෙක්ස් ආක්‍රමණික ශාකය පැතිරීම පාලනය කිරීම සඳහා විවිධ සංවිධාන, රාජ්‍ය ආයතන හා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මැදිහත්ව කටයුතු කලද මේ දක්වා එය නිසි පරිදි පාලනය කිරීමට නොහැකි වී තිබුණු බව නිරීක්ෂණය විය.



3.1 3.2

රූප සටහන - 03 - ආක්‍රමණශීලී ශාක වල පැතිරීම

(ආ) හෝර්ටන් තැන්නේ දක්නට ලැබෙන කැපී පෙනෙන ශාක විශේෂයක් ලෙස මහරත්මල් (*Rhododendron arboretum*) හැඳින්වේ. අප්‍රේල් සිට ජූලි දක්වා කාලයේදී මේවා තද රතු පැහැති මලින් පිරී යයි. පක්ෂීන් මගින් පරාගනය සිදුවන මහරත්මල් ශාකය ආශ්‍රිතව ශ්‍රී ලංකාවට ආවේණික පක්ෂියෙකු වන ශ්‍රී ලංකා සිතැසියා (*Zosterops Ceylonensis)* දක්නට ලැබේ. වර්තමානයේ මෙම ශාකය හෝර්ටන් තැන්නේ තෘණ භූමි පුරා කුඩා ප්‍රමාණයේ හා විශාල ගස් වශයෙන් ඉහළ ප්‍රමාණයක් දක්නට ලැබෙන අතර ශීඝ්‍ර පැතිරීයාමක් දක්නට ලැබේ. මේ ආකාරයට ශීඝ්‍ර වර්ධනයක් සිදු වුවහොත් අනාගතයේදි තෘණ භූමි වල පැවැත්මට තර්ජනයක් විය හැකි අතර විද්‍යාත්මක දැනුම භාවිතා කර පරිසර හිතකාමී ලෙස කලමනාකරණය කිරිමට සැලසුම් කිරීමක් කලයුතු බව ක්ෂේත්‍ර පරීක්ෂාවේදී පැවති සාකච්ඡාවට අනුව නිරීක්ෂණය විය. මහරත්මල් ශාකයේ පැතිරීම වර්ධනය වී ගස් විශාල ලෙස වැඩුණු පසුව පැතිරීම පාලනය කිරිමට යාමෙන් තෘණ භූමියට සිදු වන හානිය ඉහළ යාම, පිරිවැය අධික වීම සහ ගෝනුන්ට ආහාර හිඟ වීම නිසා ඔවුන්ගේ ගහනය අඩුවීම තුළින් හෝර්ටන් තැන්නට ඇති සංචාරක ආකර්ෂණය අඩුවීම යන ගැටළු රැසකට මුහුණ දීමට සිදු වනු ඇත.

රූපසටහන **- 04 -** මහරත්මල් ශාකයේ පැතිරීම

3.3.2 මින්නේරිය ජාතික උද්‍යානය

මින්නේරිය ජාතික උද්‍යානයේ හෙක්ටයාර් 1,160 ක් වූ තෘණ භූමි ප්‍රමාණයෙන් ආක්‍රමණික ශාක පැතිරීම පිළිබඳ පහත පරිදි විස්තර කල හැකි වේ.

පහත නිරීක්ෂණ විය.

වගු අංක - 09 - මින්නේරිය ජාතික උද්‍යානයේ ආක්‍රමණික ශාක පැතිරීම

තෘණ භූමි ප්‍රමාණය	**ආක්‍රමණික ශාක පැතිරීම**	**ආක්‍රමණික ශාක වර්ග**
වැව් පිටිය හෙක්ටයාර් 1000	භූමියෙන් 30%	අගඩ,කයිල
මහ පිටිය හෙක්ටයාර් 20	භූමියෙන් 75%	පොඩිසිංඤ්ඤෝමරං
වේරපිටිය හෙක්ටයාර් 10	භූමියෙන් 75%	පොඩිසිංඤ්ඤෝමරං, ලන්ටානා
උද්‍යාන මාර්ග පද්ධති හෙක්ටයාර් 100	භූමියෙන් 60%	පොඩිසිංඤ්ඤෝමරං , ලන්ටානා
උණ පිටිය හෙක්ටයාර් 20	භූමියෙන් 75%	කටුඋණ,ලන්ටානා, පොඩිසිංඤ්ඤෝමරං
විදුලි රැහැන් මාර්ග හෙක්ටයාර් 10	භූමියෙන් 75%	පොඩිසිංඤ්ඤෝමරං

(උද්‍යාන භාරකරු මගින් ලබාගත් දත්ත)

(අ) ඉහත සටහන අනුව මින්නේරිය ජාතික උද්‍යානය තුළ ඇති සීමිත තෘණ භූමි ප්‍රමාණයේ ආක්‍රමණික ශාක පැතිරී යාම තෘණ ආහාරයට ගන්නා සතුන්ගේ පැවැත්මට ඉතා හානිකර වන අතර උද්‍යානයේ පැවැත්මටද බාධාවක් විය හැකි බව නිරීක්ෂණය විය. තෘණ භූමි පුරා ආක්‍රමණික ශාක පැතිරී ඇති ආකාරය භෞතික පරීක්ෂාවේදී ද තහවුරු වූ අතර උද්‍යානයේ තෘණ භූමි පුරා පැතිරී ඇති ඒක වාර්ෂික හා බහු වාර්ෂික ආක්‍රමණශීලී ශාක හඳුනාගෙන පැතිරීයාම පාලනය කිරීම විද්‍යාත්මක ක්‍රමවේදයකට අනුව අඛණ්ඩව සිදුකල යුතු වුවද එසේ සිදු කර නොතිබුණ බව නිරීක්ෂණය විය.

(ආ) අලි හා ඇතුන් විශාල ප්‍රමාණයක් එකම ස්ථානයක සිට නැරඹිය හැකි ලෝකයේ සුවිශේෂී ස්ථානයක් වන මින්නේරිය ජාතික උද්‍යානයට වර්තමානයේදී අලින්ගේ පැමිණීම විශාල වශයෙන් අඩුවී ගොස් ඇති අතර උද්‍යානය තුළ තෘණ භූමි පැතිරී පවතින වපසරිය අඩුවීම එයට ප්‍රධාන වශයෙන් හේතුවක් වී තිබූ බව ද නිරීක්ෂණය විය.

5.1

5.2

5.3

5.4

රූප සටහන - 05 - මින්නේරිය ජාතික උද්‍යානයේ ආක්‍රමණික ශාක පැතිරීම

3.3.3 කවුඩුල්ල ජාතික උද්‍යානය

පහත නිරීක්ෂණයන් විය.

(අ) කවුඩුල්ල ජාතික උද්‍යානයේ හෙක්ටයාර 1,080 ක් වූ තෘණ භූමි ප්‍රමාණයෙන් කවුඩුල්ල වැව් පිටිය, දොර නවය ප්‍රදේශය, දොර දෙක ප්‍රදේශය, දොර හතර ප්‍රදේශය, මයිල පිටිය ප්‍රදේශය යන ප්‍රදේශවල අඟඩ, පොඩිසිඤ්ඤෝමරන්, කයිල වැනි ආක්‍රමණික ශාක විශාල ලෙස පැතිරී ඇති බව 2022 ජනවාරි 21 දින සිදුකරන ලද ක්ෂේත්‍ර පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ආ) ප්‍රධාන වශයෙන් තෘණ ආහාරයට ගන්නා සතුන් විශාල සංඛ්‍යාවක් සිටින මෙම ජාතික උද්‍යාන තුළ ආක්‍රමණික ශාක පැතිරීම පාලනය කිරීමට දැඩි අවධානයක් යොමුකල යුතු අතර එම කටයුතු ඉතා කඩිනමින් නොකඩවා කල යුතු බව නිරීක්ෂණය විය.



රූප සටහන - 06 - කවුඩුල්ල ජාතික උද්‍යානයේ ආක්‍රමණික ශාක පැතිරීම

3.3.4 කලාවැව ජාතික උද්‍යානය

කලා වැව ජාතික උද්‍යානය තුළ පිහිටි කලාවැව ජලාශය තුළ විවිධ ස්ථාන වල අඟඩ, ජපන් ජබර හා සැල්විනියා වැනි ආක්‍රමණශීලි ශාක පැතිරී තිබෙනු දක්නට ලැබුණු අතර ඒවා පාලනය කිරීමට ක්‍රමවත් වැඩ පිළිවෙලක් යොදාගෙන නොතිබුණි.

රූප සටහන - 07 - කලාවැව ජාතික උද්‍යානයේ ආක්‍රමණශීලි ශාක පැතිරීම

3.3.5 ලුණුගම්වෙහෙර ජාතික උද්‍යානය

ලුණුගම්වෙහෙර ජාතික උද්‍යානය තුළ ඇති මුළු තෘණ භූමි ප්‍රමාණය දළ වශයෙන් හෙක්ටයාර් 3,000 ක් පමණ වන අතර ඉන් හෙක්ටයාර් 2,000 ක පමණ භූමි ප්‍රමාණයක ලැන්ටානා, පොඩිසිඤ්ඤෝමරන්, කැප්පෙටියා වැනි ආක්‍රමණික ශාක පැතිරී ඇති නමුත් ආක්‍රමණශීලී ශාකවල පැතිරීම පාලනය කර ඇත්තේ දැනට හෙක්ටයාර් 1,000 ක පමණ භූමි ප්‍රමාණයක පමණක් වේ. අලි ඇතුන් සහ අනෙකුත් ශාක භක්ෂක සතුන්ගේ ආහාර හා වාසස්ථාන සඳහා පවතින මෙම සීමිත භූමි ප්‍රමාණයද අහිමි වී යාම ඉතා ගැටළු සහගත වන අතර ආක්‍රමණශීලී ශාක පැතිරීම අඛණ්ඩව පාලනය කිරීමට ඉක්මන් ක්‍රියාමාර්ග ගැනීම ඉතා වැදගත් බව නිරීක්ෂණය විය.

රූප සටහන - 08 - ලුණුගම්වෙහෙර ජාතික උද්‍යානයේ ආක්‍රමණශීලී ශාක පැතිරීම

3.3.6 කුමන ජාතික උද්‍යානය

පහත නිරීක්ෂණයන් විය.

(අ) කුමන ජාතික උද්‍යානය සතු තෘණ භූමි ප්‍රමාණය දළ වශයෙන් හෙක්ටයාර් 8,000 ක් පමණ වන අතර ඉන් හෙක්ටයාර් 1,025ක් පමණ (සියයට 12.81) ආක්‍රමණික ශාක වන ගඳපාන, කටු පතොක්, පොඩිසිඤ්ඤෝමරන් වැනි ආක්‍රමණශීලී ශාක පැතිරී ඇති බවත් 2021 වර්ෂය වන විට ආක්‍රමණශීලී ශාක පැතිරීම පාලනය කර ඇත්තේ හෙක්ටයාර් 55 ක් එනම් සියයට 5.36 ක් තරම් ඉතා සුළු භූමි ප්‍රමාණයක බවත් අනාවරණය විය. ශාක භක්ෂක සතුන් ඉතා විශාල ප්‍රමාණයක් වාසය කරන මෙම ජාතික උද්‍යානය තුළ තෘණ භූමි කළමනාකරණය ඉතා අත්‍යවශ්‍ය කරුණක් බව නිරීක්ෂණය වූ අතර එමගින් එම සතුන්ට ප්‍රමාණවත් ආහාර, ජලය, වාසස්ථාන නිරායාසයෙන් සැපිරීම සිදු වන බව තවදුරටත් නිරීක්ෂණය විය.

(ආ) අලි ඇතුන්ගේ සංචරණ සීමාවන් විශාල වපසරියක් පුරා පැතිර ඇති බැවින් රක්ෂිත උද්‍යාන ජෛව පද්ධති වල තිරසර පැවැත්ම මනා කළමනාකරණය තුළින් (ආහාර වල ප්‍රමාණාත්මකභාවය හා ගුණාත්මකභාවය) ඇතිවිය හැකි අලිමිනිස් ගැටුම වැනි සමාජීය ගැටළු පාලනය කරගැනීමට හැකි බව නිරීක්ෂණය විය.

3.3.7 ලාහුගල ජාතික උද්‍යානය

ලාහුගල ජාතික උද්‍යානය තුළ මුළු තෘණ භූමි ප්‍රමාණය දළ වශයෙන් හෙක්ටයාර් 1,408 ක් පමණ වන අතර, මින් හෙක්ටයාර් 543.48 ක් පුරා ආක්‍රමණශීලි ශාක වන ජපන්ජබර, පටස් හා පොඩිසිඤ්ඤෝමරන් වැනි ශාක පැතිරී තිබුණි. මෙම ආක්‍රමණශීලි ශාකවල පැතිරීම පාලනය කර ඇත්තේ හෙක්ටයාර් 10 ක් පමණ එනම් සියයට 1.54 ක් වූ ඉතා කුඩා ප්‍රදේශයක වන අතර මෙම ජාතික උද්‍යානය තුළ තිබෙන විශාලම වැව වන මහ වැවෙහි (ලාහුගල වැව) ජපන් ජබර පැතිරී තිබුණි.

රූප සටහන - 09 - ලාහුගල ජාතික උද්‍යානයේ ආක්‍රමණශීලී ශාක පැතිරීම

3.3.8 හොරොව්පතාන ජාතික උද්‍යානය

හොරොව්පතාන ජාතික උද්‍යානයේ 2021 වර්ෂය වන විට තෘණ භූමි ප්‍රමාණය දළ වශයෙන් හෙක්ටයාර් 120 ක් පමණක් බවත් ඉන් හෙක්ටයාර 35 පුරා ආක්‍රමණශීලි ශාක පැතිර ඇති බව අනාවරණය විය. 2021 වර්ෂය වන විට එයින් හෙක්ටයාර් 29 ක් පමණ ප්‍රමාණයක ආක්‍රමණශීලී ශාක පැතිරීම පාලනය කර ඇති බව වාර්තා විය. මෙම ජාතික උද්‍යානය තුළදළ වශයෙන් මුවන් හා ගෝනුන් 100 කට වැඩි සංඛ්‍යාවක් අලි 50-75 අතර සංඛ්‍යාවක් වාස භූමිය බවට පත් කර ගෙන සිටින බව අනාවරණය වූ අතර කුඩා භූමි ප්‍රමාණයක් හිමි මෙම උද්‍යානයේ ද ආක්‍රමණශීලී ශාක පැතිරීම අඛන්ඩව පාලනය කිරීම සිදු වී නොතිබුණි. මෙය එහි ජීවත්වන ශාක භක්ෂක සතුන්ගේ පැවැත්මට මෙන්ම තෘණ භූමි ආරක්ෂණ ශාක පද්ධතියේ පැවැත්මටද හානිකර වේ.

3.3.9 විගණනයට භාජනය වූ ජාතික උද්‍යානවල ඇති තෘණ භූමි සියල්ලකම ආක්‍රමණික ශාක පැතිරී තිබුණු අතර ඒවා තෘණ භූමිවල පැවැත්මට තර්ජනයක්ව පවතින බව නිරීක්ෂණය විය.

3.4. අනවසර පදිංචි වීම් හා අනවසර වගා කිරීම්

එක් එක් ජාතික උද්‍යානවල අනවසර ලෙස සිදු කරන වගාවන් එහි ජෛව පද්ධතියේ පැවැත්මට අහිතකර ලෙස බලපාන අතර, නෛතික වශයෙන් හඳුනාගෙන ඇති භූමි ප්‍රමාණයන් වල වපසරිය ක්‍රමයෙන් හීන වීම මගින් දැඩි පාරිසරික හා සමාජ ගැටළු ගණනාවක් ඇතිවීමට ඉඩකඩ තිබෙන බව විගණනයේදී නිරීක්ෂණය විය. තවද ඉහත පරිදි ජාතික උද්‍යාන වල භූමි ප්‍රමාණයන් උද්‍යානයේ වෙසෙන සතුන්ට අහිමි වීම එම සතුන්ගේ පැවැත්මට හානිකර විය හැකි වන අතර සතුන්ගේ ආහාර හා වාසස්ථාන අවම වීමටද බලපානු ලබන කරුණක් බව නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. මේ සඳහා අදාල වන නීති රීති පැවතියද එම නීති රීති ක්‍රියාත්මක වීමේදී යම් යම් බලපෑම් මත එම නීති රීති නිසි පරිදි ක්‍රියාත්මක නොවන බව නිරීක්ෂණය විය. අදාල නිලධාරීන්ට බලය ක්‍රියාත්මක කිරීමට පවතින අවහිරතාද මේ සඳහා හේතුවී තිබුණි.

3.4.1. ජාතික උද්‍යාන මට්ටමින් ඇති වී ඇති බලපෑම

3.4.1.1. මින්නේරිය ජාතික උද්‍යානය

මින්නේරිය ජාතික උද්‍යානය තුළ හිඟුරක්ගොඩ මහසෙන් ග්‍රාම නිලධාරී වසමේ ගල් ළිඳ මහ වැව යටතේ කුඹුරු අක්කර 110 ක් තුළ බලපත්‍ර සහිතව සහ අනවසර පාරම්පරික කුඹුරු වගා කිරීමට උත්සාහ කිරීම හේතුවෙන් නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති බව අනාවරණය විය. සීමිත ඉඩක් සහිත මෙම ජාතික උද්‍යානයේ ඉහත සඳහන් පරිදි වන සතුන්ට භූමිය අහිමිවීම මගින් එම සතුන්ගේ පැවැත්මට හානි කර විය හැකි බව නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

3.4.1.2. කවුඩුල්ල ජාතික උද්‍යානය

කවුඩුල්ල ජාතික උද්‍යානය තුළ අනවසර කුඹුරු වගා කරන ස්ථාන නිරීක්ෂණය වූ අතර සාම්ප්‍රදායික වගා භූමි ලෙස වසර ගණනාවක සිට වගා නොකල ස්ථාන වගා කිරීම සඳහා ඉල්ලුම් කිරීම ජාතික උද්‍යානය මුහුණ දෙන විශාල ගැටලුවක් වී තිබේ. අනවසර කුඹුරු වගා කිරීම් පිළිබඳ විස්තර පහත පරිදි වේ.

වගු අංක - 10 - කවුඩුල්ල ජාතික උද්‍යානය තුළ අනවසර කුඹුරු වගා කිරීම්

අනවසර කුඹුරු වගා කරන ප්‍රදේශ	අනවසර වගා කරන භූමි ප්‍රමාණය (දළ වශයෙන් අක්කර)
පනහ පිටිය	72
පහල වෙල	42
පලු වද්දන	06
	120

පහත නිරීක්ෂණ විය.

(ඇ) 2022 ජනවාරි 21 දින සිදුකරන ලද ක්ෂේත්‍ර පරික්ෂාවේදී ද කවුඩුල්ල ජාතික උද්‍යානය තුළ අනවසර කුඹුරු වගා කිරීම් නිරීක්ෂණය වූ අතර ඉහත පරිදි අක්කර 120 කට ආසන්න ප්‍රදේශයක අනවසර කුඹුරු වගා කිරීම සිදුකර තිබුණි. ඉහත ප්‍රදේශය තෘණ භූමි ලෙස පැවති ප්‍රදේශයක් බව අනාවරණය වූ අතර එම භූමිය අහිමි වීම සෘජුවම උද්‍යානය තුළසිටින සතුන්ගේ ආහාර හා වාසස්ථාන අවම වීමට බලපාන කරුණකි. වර්තමානයේ මේ හේතුවෙන් ආහාර සොයා අලි ගම් වැදීම අලි මිනිස් ගැටුම උග්‍ර වීමට හේතුවන ප්‍රධාන කරුණක් වී ඇත.

රූප සටහන - 10 - කවුඩුල්ල ජාතික උද්‍යානය තුළ අනවසර කුඹුරු වගා කරන ස්ථාන

3.4.1.3. ලුණුගම්වෙහෙර ජාතික උද්‍යානය

1995 වර්ෂයේදී ජාතික උද්‍යානයක් බවට ප්‍රකාශකරන අවස්ථාවේ සිටි පදිංචිකරුවන් ලෙස පවසමින් විශාල භූමි ප්‍රමාණයක මිනිසුන් පදිංචිව සිටින බව හා උද්‍යානය ඇතුළත ඉඩම්වල අනවසර වගාකිරීම් හා කුඹුරු වගාකර ඇති බව අනාවරණය විය.



රූප සටහන - 11 - ලුණුගම්වෙහෙර ජාතික උද්‍යානය තුළ අනවසර වගාකිරීම් හා පදිංචි වීම්

3.4.2. මායිම් ගැටළු පැවතීම

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ජාතික උද්‍යාන ගැසට් පත්‍ර මගින් ප්‍රකාශ කිරීමේදී ඒවායේ මායිම් තීරණය කර මායිම් ගල් යොදා සලකුණු කළ යුතු වුවද එසේ සිදු කර නොතිබුණි.

3.4.2.1. ලුණුගම්වෙහෙර ජාතික උද්‍යානයේ බෝගහ වැව, දෙව්රම්වෙහෙර හා කරවිලේ දඹේ ප්‍රදේශයේ මායිම් සම්බන්ධ ගැටළු තිබෙන බවට අනාවරණය වූ අතර මෙම මායිම් ගැටළු නිරවුල් නොකිරීම ජාතික උද්‍යානයේ යහ පැවැත්මට සහ ආරක්ෂාවට ගැටළුවක් බව නිරීක්ෂණය විය.

3.4.2.2. ලාහුගල ජාතික උද්‍යානයේ නැගෙනහිර හා බටහිර මායිමේ, මායිම්වල ගැටළු පවතින බවත් මෙම උද්‍යානයේ භූමියට අයත් භූමිවල අනවසර කුඹුරු වගාකිරීම් හා වෙනත් කෘෂිකර්මාන්ත කටයුතු සිදුවන බවත් අනාවරණය වූ අතර නැගෙනහිර මායිමේ මායිම් නිවැරදිව ලකුණුකර නොමැති වීම මෙම ගැටළුවට හේතු වී තිබුණි.

3.4.2.3. හොරොව්පතාන ජාතික උද්‍යානය ප්‍රකාශයට පත් කිරීමේදී ස්වාභාවික මායිම් මත නොව GPS පාඨාංක මත ප්‍රකාශයට පත්කර ඇති ජාතික උද්‍යානයක් බැවින් මෙම ප්‍රදේශයේ ජනතාව උද්‍යානයට ආසන්නයේ හේන් ගොවිතැන් සිදුකිරීමේ දී ගොවීන් විසින් ජාතික උද්‍යානයේ ඉඩම් අත්පත් කර ගැනීමක් සිදුකරන බව වාර්තා විය. දැනට මායිම් ලකුණු කර ඇත්තේ කිලෝ මීටර් 10 ක පමණ ප්‍රදේශයක් වන අතර මායිම් ගැටළු සම්බන්ධයෙන් අදාල නිලධාරීන් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ සෑහීමකට පත්විය නොහැකි විය.

3.4.3. ගවයින් උද්‍යාන තුළට අනවසරයෙන් ඇතුළු කිරීම හා ගව ගාල් පවත්වා ගෙන යාම

2009 අංක 22 දරන වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක (සංශෝධන) පනතේ (9) (5) වගන්තිය අනුව කිසිම තැනැත්තකු විසින් ගෘහාශ්‍රිත සතෙකු යම් ජාතික රක්ෂිත භූමියකට දක්කාගෙන යාම හෝ එබඳු සතෙකුට එවැනි භූමියක දඬාවතේ යෑමට ඉඩදීම නොකළ යුතු බවට දක්වා තිබේ. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් එය අධීක්ෂණය හා නියාමනය සිදු කරනු ලැබේ.

පහත කරුණු නිරීක්ෂණය විය.

3.4.3.1. මින්නේරිය ජාතික උද්‍යානය

අනවසර ගවයන් (මී ගවයන් හා එළ ගවයන්) 500-750 අතර ප්‍රමාණයක් ජාතික උද්‍යානය තුළනිරන්තරයෙන් සැරිසරන බව සංඛ්‍යා දත්ත අනුව පැහැදිලි වේ. මෙය උද්‍යානයේ තෘණ ආහාරයට ගන්නා සතුන්ට විශාල තර්ජනයක් වන අතර ශාක පද්ධතියටද දැඩි බලපෑමක් ඇති කරනු ලැබේ. ඒ අනුව මෙම ගවයන් තෘණ උලා කන ආකාරයට ඒවා නැවත වැවීමට දීර්ඝ කාලයක් ගත වන බවත් ගවකුර වලින් තෘණ භූමියට හානි සිදු වන බවත් අනාවරණය වූ අතර විගණන ක්ෂේත්‍ර පරික්ෂාවේදී මේ බව තවදුරටත් තහවුරු විය. මෙම ගැටළුව ජාතික උද්‍යාන බොහොමයකට ගැටළුවක් වී ඇති බැවින් ඒ සඳහාත් ගෘහ ආශ්‍රිත ගවයන්ගේ ආහාර ලබා ගැනීමේ ක්‍රමවේදය සඳහාත් ස්ථිර විසඳුමක් ලබා දිය යුතු බව විගණනයේදී නිරීක්ෂණය විය.

3.4.3.2. කවුඩුල්ල ජාතික උද්‍යානය

මේ සම්බන්ධයෙන් වූ නිරීක්ෂණ පහත පරිදි විය.

(අ) ගෘහාශ්‍රිත ගවයන් 1,500ක් පමණ මෙම උද්‍යානය තුළ සිටින බවත් එය උද්‍යානය තුළ ජීවත්වන තෘණ ආහාරයට ගන්නා සතුන්ට විශාල තර්ජනයක් වී ඇති බවත් අනාවරණය විය.

(ආ) ජාතික උද්‍යානය තුළ අනවසරයෙන් ගවගාලක් පවත්වාගෙන යන බව විගණන ක්ෂේත්‍ර පරික්ෂාවේදී තහවුරු වූ අතර ජාතික උද්‍යානයක් තුළ මෙවැනි අනීතික ක්‍රියා සිදු වීම වළක්වාලීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සිදු කල යුතු බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) උද්‍යානය තුළජීවත්ව සිටින සතුන්ට ඉතා සීමිත තෘණ භූමි ප්‍රමාණයක් ඇති අතර එම භූමි ප්‍රමාණයේද ආක්‍රමණික ශාක පැතිරීම, අනවසර වගා කිරීම් සිදුකිරීම වැව් ප්‍රතිසංස්කරණය නොකිරීම වැනි ගැටළු රැසක් ඇති වී තිබෙන අතර එම සීමිත තෘණ භූමිවල ගෘහාශ්‍රිත ගවයන් ද පැමිණ තෘණ උලා කෑම ජාතික උද්‍යානයේ පැවැත්මට තර්ජනයක් වන බැවින් මෙම ජාතික උද්‍යානයන්හි පැවැත්ම සඳහා වගකිව යුතු සම්බන්ධිත ආයතන සියල්ල ඒකාබද්ධව කටයුතු කර කඩිනම් පියවර ගත යුතු බව නිරීක්ෂණය විය.

රූප සටහන - 12 - අනවසර ගව ගාල පැවති බවට නිරීක්ෂිත ප්‍රදේශය

(ඇ) මෙම ජාතික උද්‍යානය ආසියානු අලින්ගේ (*Elephas Maximus*) ස්වභාවික හැසිරීම් රටාවන් කදිමට නැරඹිය හැකි ස්ථානයක් බව හා ජලාශය ආශ්‍රිතව පිහිටි තණබිම් අලින්ට මහත් වූ පිටිවහලක් බව අනාවරණය වූ අතර විවිධ වර්ගයේ තෘණ භූමි සහිත මෙම පරිසර පද්ධතිය සංරක්ෂණය හා වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය විගණනයේදී නිරීක්ෂණය විය.

3.4.3.3. කලාවැව ජාතික උද්‍යානය

අනවසරයෙන් කලාවැව ජාතික උද්‍යානය තුළට ඇතුල්කරන ගවයින් 5,000 කට ආසන්න ප්‍රමාණයක් සිටින බවත් ඒ හේතුවෙන් වන අලින්ගේ ආහාර සඳහා පවතින තෘණ භූමි ප්‍රමාණය අහිමි වීම, ගව කුර මගින් තෘණ පැළෑටි විනාශ වීම හා තෘණ උලාකෑම මගින් වන සතුන්ට රෝග බෝවීම (මුඛ රෝග, කුර රෝග) සිදුවිය හැකි බව අනාවරණය විය. එමෙන්ම මෙම උද්‍යානය තුළ අනවසර ගව ගාල්ද පවත්වාගෙන යන බව නිරීක්ෂණය විය.



රූප සටහන - 13 - කලාවැව ජාතික උද්‍යානය තුළ අනවසර ගව ගාල පැවති බවට නිරීක්ෂණය වූ ප්‍රදේශය

3.4.3.4. ලුණුගම්වෙහෙර ජාතික උද්‍යානය

ගම්වැසියන් විසින් ගෘහස්ත ගව රංචු විශාල ප්‍රමාණයක් උද්‍යානය තුළට ඇතුල් කර වැව් පිටිවල තෘණ ආහාරයට ගැනීමට සලස්වන අතර අනවසර ගව ගාල් 11 ක් පමණ මෙම උද්‍යානය තුළ පවත්වාගෙන යන බව අනාවරණය වූ අතර 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා නඩු පැවරීම් 16 ක් සිදුකර තිබුණද මෙම ගවගාල් මෙලෙස තවදුරටත් පවත්වාගෙන යනු ලබන බව නිරීක්ෂණය විය.

රූප සටහන - 14 - ලුණුගම්වෙහෙර ජාතික උද්‍යානය තුළ ඇති අනවසර ගව ගාල

3.4.3.5. ලාහුගල ජාතික උද්‍යානය

ලාහුගල ජාතික උද්‍යානයේ නැගෙනහිර මායිමේ ගෘහස්ථ ගවයින් ජාතික උද්‍යානය තුළට ඇතුළු කරන බවත් නීතිමය ක්‍රියාමර්ග ගෙන තිබුණද එම තත්ත්වය පාලනය කළ නොහැකි ගැටළුවක් බවට පත්වී තිබෙන බවත් අනාවරණය විය. ජාතික උද්‍යානය තුළ තිබෙන සීමිත තෘණ භූමිවල ඇති තෘණ විශාල ගව රංචු විසින් ආහාරයට ගැනීමෙන් ජාතික උද්‍යානය තුළ සිටින අනෙකුත් ශාක භක්ෂක සතුන්ට ආහාර නොමැති වීම හෝ අඩුවීම සිදු වන බව නිරීක්ෂණය විය.

මින්නේරිය, කවුඩුල්ල, කලා වැව, ලුණුගම්වෙහෙර, ලාහුගල යන ජාතික උද්‍යානවලට අනවසර ලෙස ගෘහස්ථ ගවයන් ඇතුලු කිරීම හේතුවෙන් තෘණ භූමිවලට සිදුවන හානිය ඉතා විශාල වන අතර ජාතික උද්‍යාන තුළවාසය කරන තෘණ භක්ෂක සතුන්ගේ ආහාර ප්‍රමාණය අඩු වීම, වන අලින් ගම් වැදීම, වගා හානි හා ජීවිත හානි කිරීම වැඩි වීමට හේතුවක් වී තිබුණි.

3.5. අනෙකුත් සාධක

ශ්‍රී ලංකාවේ පාරිසරික පද්ධතිය තුලනාත්මකව පවත්වාගෙන යාමට බලපාන සාධක අතර මානව ක්‍රියාකාරකම්, විවිධ සංවර්ධන ව්‍යාපෘති සහ විවිධ ස්වභාවික කාරණා ප්‍රධාන වශයෙන් වැදගත් වන අතර නියැදි පරීක්ෂාවට ලක් වූ ජාතික උද්‍යාන කිහිපයක එවැනි බලපෑම් සාරාංශ කොට පහත දක්වා ඇත.

3.5.1. හෝර්ටන්තැන්න ජාතික උද්‍යානය

හෝර්ටන් තැන්න ජාතික උද්‍යානයේ දක්නට ලැබෙන ප්‍රධාන සත්ව කොට්ඨාශ ලෙස ගෝනුන් (*Cervus unicolour)* දිවියා (*Panthera Pardus Kotiya)* වලස් වඳුරා (*Semnopituecus.vetuls Monticola*) වැලි මුවා (*Muntiacus Muntjalc Malabaricus)* දඬු ලේනා (*Ratufa Macrour)* බළල් දිවියා (*Felis rabiginosa*) වල් ඌරා (*Sus Scrofa)* හාවා (*Lepus nigricollis)* ආදී සතුන් උද්‍යානයේ නිතර ගැවසෙන සතුන් වන අතර මෙම සතුන් ආරක්ෂා කිරිමට වනජීවී දෙපාර්තමේන්තුව මගින් පරිශ්‍රමයක් දැරුවද අනවසර දඩයම් කිරිම් මෙම තෘණ භූමිය තුළසිදුකරන බව අදාල නිලධාරීන් විසින් තහවුරු කරන ලදී.

මිනිසා විසින් සිදු කරනු ලබන අනුවණ ක්‍රියා හේතුවෙන් හෝර්ටන් තැන්නේ ගිණි ගැනීම් සිදු වන අතර ඒ තුළින් තෘණ භූමියට හා වනාන්තරයට විශාල හානියක් සිදු කරයි. 1989 වර්ෂයේ එලෙස ඇති වූ ගින්නකින් වනාන්තර වලටද පැතිරී විශාල විනාශයක් සිදු කර තිබෙන අතර වර්තමානයේ වනජීවී දෙපාර්තමේන්තුව විසින් කැලෑ ගිනි තැබීම සම්බන්ධයෙන් මහජනයා දැනුවත් කිරීම තුළින් යම්තාක් දුරට පාලනයක් සිදු කර ඇත.

විගණනය විසින් ක්ෂේත්‍ර පරීක්ෂාව සිදු කලේ 2021 ඔක්තෝබර් මස එනම් සංචාරකයින් ඉතා අවම කාලයක වුවද ස්ථාන කිහිපයක සංචාරකයන් විසින් භාවිතා කරන ලද මුව ආවරණ තෘණ භූමිය තුළබිම දමා තිබෙනු දක්නට ලැබුණු අතර එවැනි ක්‍රියා ජාතික උද්‍යානයේ පාරිසරික පද්ධතිය තුලනාත්මකව පවත්වාගෙන යාමට බාධාවක් වන බව විගණනයේදී නිරීක්ෂණය විය.

3.5.2. මින්නේරිය ජාතික උද්‍යානය

3.5.2.1. මොරගහකන්ද ජලාශ ව්‍යාපෘතිය තෘණ භූමි වලට සිදුකරන බලපෑම

කවුඩුල්ල ජාතික උද්‍යානය, මින්නේරිය ජාතික උද්‍යානය සහ හුරුළු ජාතික උද්‍යානය යන ජාතික උද්‍යාන 03 පදනම් කරගෙන වර්ෂය මුළුල්ලේ ස්වභාවික කාලගුණික රටාව අනුව වන අලින්ගෙන් සංක්‍රමණය පහත ආකාරයට සිදුවන බව අනාවරණය විය.

වගු අංක - 11 - ස්වභාවික කාලගුණික රටාව අනුව වන අලින්ගෙන් සංක්‍රමණය

වන අලින් සංක්‍රමණය වන කාල සීමාව	ජාතික උයානය
මැයි,ජූනි,ජූලි,අගෝස්තු,ඔක්තෝබර් මස මැද	මින්නේරිය ජාතික උද්‍යානය
ඔක්තෝබර්,නොවැම්බර්,දෙසැම්බර්,ජනවාරි මැද	කවුඩුල්ල ජාතික උද්‍යානය
ජනවාරි,පෙබරවාරි,මාර්තු,අප්‍රේල් අග	හුරුළු ජාතික උද්‍යානය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මින්නේරිය ජාතික උද්‍යානය තුලට ඉහත කාල සීමාවන් තුළ වන අලින් පැමිණෙන්නේ කවුඩුල්ල සහ මින්නේරි වැව් පිටියේ ඇති තෘණ ආහාරයට ගැනීම මූලික කර ගෙන බව අනාවරණය විය. ඉහත කාල සීමාව තුළ මෙම වැව් වල ජලය අඩු වීමත් සමඟ හෙක්ටයාර් 1,000 ක පමණ ප්‍රදේශයක තෘණ දලු ලා වැඩෙන කාල සීමාව තුළ වන අලීන් මෙම තෘණ ආහාරයට ගැනීම ඉතා ප්‍රිය බැවින් මෙම උද්‍යානය කරා සංක්‍රමණය වන බව අනාවරණය විය. මොරගහකන්ද ජලාශ ව්‍යාපෘතිය හේතුවෙන් ස්වාභාවික කාලගුණික රටාවෙන් බැහැරව වර්ෂය පුරා නිරන්තරයෙන් වැව් වල ජලය පිරී යාම හේතුවෙන් වල් අලීන් හුරු වූ සංක්‍රමණික හා හැසිරීම් චර්යා රටාවට සෘජු ලෙස බලපා ඇති බවත් මේ හේතුවෙන් වල් අලි රංචු විවිධ ප්‍රදේශවලට විශේෂයෙන් වැලිකන්ද, දිඹුලාගල, සෝමාවතිය හා රක්ෂිත වලින් බැහැර ප්‍රදේශවලට ආහාර සොයා සංක්‍රමණය වීම ආරම්භ කර ඇති අතර මේ හේතුවෙන් අලි මිනිස් ගැටුම වැඩි වී ඇති බවට පසුගිය වසරවල වල් අලි හානි දත්ත විශ්ලේෂණයේදී නිරීක්ෂණය විය. එසේම මොරගහකන්ද ජලාශ ව්‍යාපෘතිය හේතුවෙන් මින්නේරිය සහ කවුඩුල්ල ජාතික උද්‍යාන වලට වාර්ෂිකව අලි එක් රැස් වීම (Area Elephant Gathering) අඩු වී ඇති බව අනාවරණය විය.

(ආ) ස්වාභාවික දේශගුණික රටාව අනුව අප්‍රේල් සිට ඔක්තෝබර් මස දක්වා මෙම ජලාශ වල ජල මට්ටම ක්‍රමයෙන් අඩු විය යුතු වුවද මොරගහකන්ද ජලාශ ව්‍යාපෘතිය මගින් විටින් විට සියයට 70 ට වැඩි ප්‍රමාණයකින් මෙම ජලාශ වල ජලය පිරවීම හේතුවෙන් වන අලින්ට අවශ්‍ය ආහාර සඳහා තෘණ පිටිය අහිමි වන බව නිරීක්ෂණය විය. මේ හේතුවෙන් ඔවුන්ට අවශ්‍ය කරන ආහාර හා වාසස්ථාන අහිමි වීමෙන් අලි මිනිස් ගැටුම සඳහා ඉඩ සැලසීම මෙන්ම සෘජුවම සංචාරකයින්ගේ පැමිණීම අඩු වීමට ද බලපා ඇති බව අනාවරණය විය.

(ඇ) මොරගහකන්ද ව්‍යාපෘතිය හේතුවෙන් මින්නේරිය ජාතික උද්‍යානයට පැමිණෙන අලි ප්‍රමාණය අඩු වී තිබෙන බව හිටපු වනජීවී අධ්‍යක්ෂ විසින් අලින්ගේ ස්වාභාවික චර්යා රටාවන් පිළිබඳ 2016 වර්ෂයේ සිට කරනු ලබන පර්යේෂණය මගින් හෙළිදරව් වී තිබේ. ඒ සඳහා මින්නේරිය ජාතික උද්‍යානය ට අලින් වැඩියෙන් පැමිණෙන 2018 වර්ෂයේ සැප්තැම්බර් මාසයේ සිට නිරීක්ෂණය සඳහා යොදාගෙන තිබුණි.

විස්තර පහත දක්වා ඇත.

වර්ෂය	මාසය	අලි සංඛ්‍යාව
2016	සැප්තැම්බර්	389
2017	සැප්තැම්බර්	402
2018	සැප්තැම්බර්	354
2019	සැප්තැම්බර්	223
2020	සැප්තැම්බර්	210
2021	සැප්තැම්බර්	20
2022	සැප්තැම්බර්	NA (Count in Progress)

(Elephant Researcher Studying the Social Behavior of elephants in the minneriya kaudulla population)

ඉහත දත්ත අනුව අලින්ගේ පැමිණීම ශීඝ්‍ර ලෙස පහත බැස තිබෙනු දක්නට ලැබෙන අතර 2017 වර්ෂයට සාපේක්ෂව 2021 වර්ෂයේ සියයට 95 කින් අලින්ගේ පැමිණීම අඩු වී ඇත. මේ අනුව අලින්ට අවශ්‍ය ආහාර හිඟ වීම නිසා 2021 වර්ෂයට වඩා 2022 වර්ෂයේ අලින් කෘෂ වී සිටිනු නිරීක්ෂණය වූ බව මෙම වර්තාවේ සටහන් කර තිබුණි. මෙසේ ආහාර හිඟ වීම ගැහැණු සතුන්ට බලපෑම තුළින් අලුතින් ඉපදෙන අලි පැටවුන් මන්ද පෝෂණයට ලක් වන බවත් එය ඔවුන්ගේ වර්ධනයට තර්ජනයක් බවත් සඳහන් කර තිබුණි. මෙම අවාසනාවන්ත තත්ත්වයට කඩිනමින් විසඳුම් සෙවීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව එක්ව කටයුතු කර සුදුසු විසඳුම් වහාම ගතයුතු බවත් එසේ නොවුන හොත් මන්ද පෝෂණය හේතුවෙන් විශාල අලි ප්‍රමාණයක් මරණයට පත් වීමට ඉඩ

ඇති බවට එම වාර්තාවෙන් අනතුරු අඟවා තිබුණි. මෙම ආහාර හිඟය සඳහා වැව් පිටි වල තෘණ භූමි ප්‍රමාණය අහිමිවී යාම ප්‍රධාන වශයෙන් බලපා ඇති බව නිරීක්ෂණය විය.

(ඇ) අලින් විසින් වගා හානි සිදු කිරීම.

මෙම (පර්යේෂණ) වාර්තාවට අනුව 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා දේපල හා වගා හානි සම්බන්ධයෙන් විස්තර පහත දක්වා ඇත.

වර්ෂය	වගා හානි සංඛ්‍යාව
2015	06
2016	02
2017	04
2018	22
2019	30

මේ අනුව මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමේදී පාරිසරික තත්ත්වයන්, වන ජීවීන්ගේ චර්යා රටාව, කෘෂිකර්මාන්තය ආදී අංශ කෙරෙහි තුලනාත්මකව අවධානය යොමු නොකිරීම මෙවැනි ගැටළු ඇති වීමට හේතු වී තිබුණි.

(Elephant Researcher Studying the Social Behavior of elephants in the minneriya kaudulla population හිටපු වන ජීවී සංරක්ෂණ, අධ්‍යක්ෂගේ පර්යේෂණ වාර්තාවකින් උපුටා ගන්නා ලදී.)

3.5.3. කවුඩුල්ල ජාතික උද්‍යානය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) කවුඩුල්ල ජාතික උද්‍යානය තුළ ඇති වැව් දෙකක් ප්‍රතිසංස්කරණය නොකිරීම

ජාතික උද්‍යාන තුළ ඇති වෙහෙරගල වැව සහ ඕලුමඩුව වැව ප්‍රතිසංස්කරණය කිරීමට යෝජනා කර තිබුණද මේ දක්වා එම කටයුතු සිදුකර නොතිබුණු අතර එම වැව් ආශ්‍රිත වැව් පිටිවල තෘණ ව්‍යාප්තිය සීමා වී ඇති අතර මෙම වැව් ආශ්‍රිත වැව්පිටි ශාක භක්ෂක සතුන්ගේ ආහාර හා වාසස්ථාන සපයන ස්ථාන බැවින් එම ස්ථාන කඩිනමින් ප්‍රතිසංස්කරණ කිරීමට කටයුතු කල යුතු බව නිරීක්ෂණය විය.

(ආ) මොරගහ කන්ද ජලාශ ව්‍යාපෘතිය මගින් කවුඩුල්ල වැවේ ජල මට්ටම කෙරෙහි ඇතිවන බලපෑම

මොරගහ කන්ද ජලාශය මගින් කවුඩුල්ල වැවට නිරන්තර ජලය නිකුත් කිරීම නිසා වර්ෂය පුරාම ජලය පිරී තිබීම හේතුවෙන් වැව් පිටියේ දළ වශයෙන් හෙක්ටයාර් 1,000 කට ආසන්න ප්‍රදේශයක පැවති තෘණ භූමි සතුන්ට අහිමි වී ගොස් ඇති බව අනාවරණය විය. ස්වභාවික කාලගුණික රටාවකට වැවේ ජලය පිරීම සහ ජලය සිඳීයාම අතීත කාලයක සිට සිදු වූ ස්වභාවික චක්‍රයක් වන අතර මෙම ජල යෝජනා ව්‍යාපෘති මගින් ස්වභාවික ක්‍රමවේදයෙන් බැහැරව ජලය සැපයීම හේතුවෙන් වන සතුන් මෙම තර්ජනයට මුහුණ පා සිටින අතර අදාල ආයතන සමඟ ඒකාබද්ධව සාකච්ඡා කර කඩිනමින් විසඳුමක් ලබා ගත යුතු බව නිරීක්ෂණය විය.

3.5.4. කලාවැව ජාතික උද්‍යානය

3.5.4.1. ජාතික උද්‍යානයක් බවට ගැසට් කර නොතිබීම

(අ) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් කහල්ලපල්ලෙකැලේ අභයභූමිය, කුරුණෑගල හා අනුරාධපුරය යන දිස්ත්‍රික්කයන් තුළ පිහිටා ඇති අතර විශාලත්වයෙන් හෙක්ටයාර් 21,690 ක් පමණ වන අතර අංක 556/5 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් 1989 ජුලි මස 11 වැනි දින ප්‍රකාශයට පත්කර තිබුණි. මෙම කහල්ලපල්ලෙකැලේ අභයභූමිය තුළ කලාවැව හා බලලුවැව පිහිටා ඇති අතර එම ජලාශ දෙක හා ඒ ආශ්‍රිත ප්‍රදේශයෙන් හෙටක්ටයාර් 5,044.97 ක ප්‍රමාණයක් වනජීවී සංරක්ෂණ කාර්යන්හි අවශ්‍යතාවය වෙනුවෙන් දැනට පවතින අභය භූමියෙන් ජාතික උද්‍යානයක් තත්ත්වයට උසස් කිරීමට තීරණය කර තිබුණි. ඒ අනුව 2015 ඔක්තෝබර් මස 17 වන දින තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යවරයා විසින් කලාවැව ජාතික උද්‍යානය විවෘත කර තිබුණි. නමුත් විගණිත දින දක්වා ගැසට් පත්‍රයක් මගින් නිත්‍යානුකූලව ප්‍රකාශයට පත් කර නොතිබුණ බව නිරීක්ෂණය විය.

(ආ) අංක වජී/වයඹ/04/02/682/2020 දරන 2020 ජුලි 23 දිනැති සහකාර අධ්‍යක්ෂ (වයඹ) ගේ ලිපියට අනුව යෝජිත කලාවැව ජාතික උද්‍යානයේ ගැසට් නිවේදනයේ කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමුකළ පසු යෝජිත කලාවැව ජාතික උද්‍යාන සීමාවට අයත් ප්‍රදේශයේ රජයේ ඉඩම් හා පුද්ගලික ඉඩම් වෙන් වෙන්ව හඳුනාගෙන අදාල වාර්තා හා සිතියම් ලබාදෙන ලෙස දිස්ත්‍රික් මිනින්දෝරු අධිකාරිගේ (අනුරාධපුර) ලිඛිත ඉල්ලීමක් කර තිබුණු අතර ඊට පිළිතුරු වශයෙන් 2021 මැයි 12 වන දින අංක 11/ම/06/ කලාවැව ජාතික උද්‍යානය/2021/Cost දරන ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් සහකාර අධ්‍යක්ෂ වනජීවී සංරක්ෂණ කලාප කාර්යාලය වෙත යොමුකර තිබුණු අතර අදාල මිනුම් ගාස්තු ලෙස රුපියල් 54,528,876 ක මුදලක් අවශ්‍ය බව දැනුම් දී තිබුණද මේ දක්වාම ඒ සම්බන්ධ ක්‍රියාමර්ග කිසිවක් ගෙන නොතිබුණි.

3.5.4.2. කලාවැවේ ජල මට්ටම ඉහළයාම හේතුවෙන් ජාතික උද්‍යානයට ඇතිවන බලපෑම - 2016 වර්ෂයෙන් පසුව කාලසීමාව

මෙම කාල සීමාව තුළදී පහත තත්ත්වයන් අනාවරණය විය.

(අ) සුළු පරිමාණ ජල විදුලි ව්‍යාපෘතිය

දඹුලු ඔය සුළු පරිමාණ ජල විදුලි ව්‍යාපෘතිය යටතේ ඉබ්බන්කටුව ජලාශයේ ජලය යොදාගෙන ජල විදුලිය නිපදවීම සිදුකරන අතර මෙම කුඩා පරිමාණ ජල විදුලි බලාගාරයෙන් නිකුත්වන ජලය දඹුලු ඔය හරහා කලාවැවට එක්රැස්වීම සිදුවීම නිසා කලා වැවේ ජල මට්ටම ඉහළ යාම සිදු වේ. මේ හේතුව නිසා කලා වැවේ වැව් පිටිය අහිමි වී ගොස් අලින් ප්‍රමුඛ වන සතුන්ට අවශ්‍ය ආහාර අහිමි වී යාමේ අවධානමක් ඇති බව නිරීක්ෂණය විය.

(ආ) වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ජලය නිකුත් කිරීම

වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් කෘෂිකාර්මික කටයුතු සඳහා සහ අනුරාධපුර නගරයේ මහජනතාවගේ පානීය ජල අවශ්‍යතාවය සඳහා නාච්චදූව හා තිසාවැවට ජලය නිකුත් කිරීමට වර්ෂය පුරාම කලාවැව හා බලලුවැව උපරිම ජල මට්ටමක පවත්වාගෙන යනු ලබයි.

රූප සටහන - 15 - වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ජලය නිකුත් කිරීම

මේ හේතුව නිසා වන අලියා ප්‍රමුඛ වන සතුන්ට ආහාර සොයාගැනීමට අවශ්‍ය තෘණ භූමි නිරාවරණය නොවීම හා කලා වැව ආශ්‍රිතව නිදහසේ සැරිසැරීමට අවශ්‍ය ඉඩකඩ අහිමිවීම හේතුවෙන් වන අලි රාත්‍රී කාලයේ මෙන්ම දිවා කාලයේදී ගම් වැදි ගම්වැසියන්ගේ වගා භූමි, හා දේපල වලට හානි කිරීම සහ මහජනතාවගේ ජීවිතවලට හානි කිරීම සීග්‍රයෙන් ඉහළ යෑම නිසා වන අලි මිනිස් ගැටුම උග්‍ර වී ඇති බවත් ඒ හේතුවෙන් වන අලි මරණ, හා වන අලි තුවාල වීම්ද බහුලව නිරීක්ෂණය වන බවටත් වාර්තා වී ඇත. ඉතාමත් වටිනා දළ ඇතෙකු ආහාර සොයා ගම්වැදීම නිසා කැකිරාව ඉලුක්කේගම බඩඉරිගු හේනකට ඇද තිබූ විදුලි සැර වැදී මියගොස් තිබුණි.

රූප සටහන - 16 - විදුලි සැර වැදී මියගිය රේවත නම් දළ ඇතා

(ඇ) විදුලි වැට අක්‍රිය වීම්

කලාවැව හා බලලුවැව ජල මට්ට ඉහළ යාම හේතුවෙන් කලාවැව හා බලලුවැව වටා ඉදිකර ඇති විදුලි වැට ආසන්නයටම ජල මට්ටම පැමිණීම සිදුවන අතර ඇතැම් ස්ථාන (ඔලන්බෑව, හෝරාපොල) විදුලි වැට ජලයෙන් යටවීම නිසා විදුලි වැට අක්‍රිය වීම මෙන්ම විදුලි වැට ආසන්නයට ජලය පැමිණීම හේතුවෙන් වන අලින්ට කලාවැව හා බලලු වැව ආශ්‍රිතව වාසස්ථාන හා සංචරණ මාර්ග අහිමිවී තිබෙන බව අනාවරණය විය. එසේම දැනට පවතින විදුලි වැට ආසන්නයටම ප්‍රදේශයේ ජනතාව අනවසරයෙන් ඉඩම් අත්පත්කර ගෙන වගා කටයුතු සිදුකරනු ලබන බව ද අනාවරණය විය.

3.5.4.3. කලාවැව ජාතික උද්‍යානය සම්බන්ධ පොදු ගැටළු

කලාවැව ජාතික උද්‍යානය සතු භෞතික හා මූල්‍ය පහසුකම් වල ගැටළු මෙන්ම ජාතික උද්‍යානය සංරක්ෂණය හා කළමනාකරණය කිරීමට අදාල පහත පොදු ගැටළු තත්ත්වයන් හේතුවෙන් ජාතික උද්‍යානය තුළ ඇති තෘණ භූමි සංරක්ෂණය කිරීම කාර්යක්ෂමව සිදු වී නොතිබුණි.

පහත පොදු ගැටළු නිරීක්ෂණය විය.

(අ) කලාවැව ජාතික උද්‍යානය සඳහා ප්‍රවේශ දොරටුවක් නොමැති අතර කාර්යාලීය ගොඩනැගිල්ලක් නොමැතිව කුලියට ගත් නිවසක දැනට කාර්යාලය පවත්වාගෙන යනු ලබයි. විජිතපුර සහ ගල්කිරියාගම ප්‍රවේශ මාර්ග දෙකෙහි කන්ටේනර් පෙට්ටිවලින් සකස් කළ තාවකාලික කාර්යාල 02 ක් පෙර පැවතියද ඒවා දැනට වසා දමා තිබුණි.

(ආ) කලාවැව ජාතික උද්‍යානය සඳහා ප්‍රමාණවත් වාහන පහසුකම් නොමැති බව නිරීක්ෂණය විය.

(ඇ) කලාවැව ජාතික උද්‍යානය නාම පුවරුවකට පමණක් සීමා වී තිබෙන අතර කිසිම ප්‍රවර්ධන කාර්යයක්, සංරක්ෂණය කිරීමක්, නඩත්තු කිරීමක් සිදුකර නොතිබුණු බව විගණන ක්ෂේත්‍ර පරීක්ෂාවේදී අනාවරණය වූ අතර ප්‍රථමයෙන් මිණුම් කටයුතු සිදුකර ගැසට් කිරීම මගින් නීත්‍යානුකූලභාවය ලබාගෙන මෙම ජාතික උද්‍යානය මුහුණදී තිබෙන ගැටළු වාරිමාර්ග දෙපාර්තමේන්තුව, මහවැලි අධිකාරිය හා ඊට සම්බන්ධ ආයතන සමඟ එකතු වී එම ගැටළු කඩිනමින් විසඳාගත යුතු බව නිරීක්ෂණය විය.

(ඈ) මෙම ජාතික උද්‍යානය තුළ සිටි වටිනා දළ ඇතුන් ඇතුළු වන අලි සම්පත රැක ගැනීමට කඩිනම් පියවර ගත යුතු අතර ඒ තුළින් සංචාරක කර්මාන්තය හා ඒ හා බැඳුනු ව්‍යාපාර දියුණු වීම තුළින් රටේ ආදායම ඉහළ නංවා ගැනීමට හැකියාව තිබුණද ඒ සඳහා කිසිදු ක්‍රියාමාර්ගක් අදාල ආයතන විසින් ගෙන නොතිබුණි.

රූප සටහන - 17 - කලාවැව ජාතික උද්‍යානයේ පිවිසුම

3.5.5. ලාහුගල ජාතික උද්‍යානය

3.5.5.1. ලාහුගල ජාතික උද්‍යානයේ පාරිසරික තත්ත්වයන් පිළිබඳ දත්ත පද්ධතියක් නොමැති වීම.

ජාතික උද්‍යානයේ ස්වාභාවික පාරිසරික තත්ත්වයන්, එහි වාසය කරන සතුන් පිළිබඳ තොරතුරු ඇතුලත් දත්ත පද්ධතියක් පවත්වාගෙන ගොස් නොතිබුණි. නිදසුනක් ලෙස ජාතික උද්‍යානයට බලපාන වර්ෂාපතන රටාව, වියළි කාලගුණය, සංක්‍රමණික අලි ඇතුන් පැමිණෙන කාල සීමාව, අලි ඇතුන් සංඛ්‍යාව, අලි පැටවුන් සංඛ්‍යාව, විශේෂ ශාරීරික ලක්ෂණ ඇති අලි ඇතුන් සංඛ්‍යාව, ස්වාභාවික වැව්වල ජල ධාරිතාව, වැව් පිටිවල භූමි ප්‍රමාණය, ජලය සිඳී යන කාලයට වැව් පිටිවල භූමි ප්‍රමාණය, එම වැව් පිටිවල තිබෙන සතුන්ට ආහාරයට ගැනීමට සුදුසු තෘණ වර්ග පිළිබඳ තොරතුරු හා අලි ඇතුන් පැමිණීමේ අඩුවක් තිබේ නම් ඊට හේතුව සංක්‍රමණික සතුන් පැමිණීම පිළිබඳ තොරතුරු, සතුන්ට වැලඳෙන රෝග, ආක්‍රමණික ශාක පැතිරීමේ රටාව, අලුතින් හඳුනාගත් ශාක වර්ග හා ජීවීන් පිළිබඳ විස්තර ආදී ජාතික උද්‍යානයක් තුළකාලීනව සිදුවන වෙනස්කම් පිළිබඳ තොරතුරු රැස්කර වාර්තා කර තබා ගැනීම ඉතාම වැදගත් බව මෙම ජාතික උද්‍යාන භෞතික විගණන පරීක්ෂා වලදී නිරීක්ෂණය විය. එසේ දත්ත පද්ධතියක් පවත්වා ගෙන යාම ජාතික උද්‍යානය තුළ ඇති තෘණභූමි සංරක්ෂණය කිරීමේදී මෙන්ම තෘණභූමි සංරක්ෂණය හා කළමනාකරණය සම්බන්ධ විවිධ ව්‍යාපෘතීන් ආරම්භ කිරීමේදී ද වැදගත් වේ.

3.5.5.2. හැඩ ඔය වාරි ව්‍යාපෘතියෙන් සිදුවන බලපෑම

අම්පාර දිස්ත්‍රික්කයේ ලාහුගල හා පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලට අයත් ලාහුගල, පානම හා පොතුවිල යන ප්‍රදේශවල යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම හා වාරි ජලය සැපයීම අරමුණු කරගෙන මෙම ව්‍යාපෘතිය 2013 වර්ෂයේ දී ක්‍රියාත්මක කර ඇත. මෙම ව්‍යාපෘතිය යටතේ හැඩ ඔය හරහා ඉදිකරන ලද අමුණක් මාර්ගයෙන් ජලය රැස්කර හැඩ ඔයේ වම් ඉවුරෙන් එන ඇළ මාර්ගය ඔස්සේ මහ වැවට ජලය පිරවීම හා වැවේ පිටවාන උස්කර බැම්මක් බැඳීම යන කරුණු හේතුවෙන් වර්ෂය පුරාම වැවේ උපරිම ජල ධාරිතාවයක් රඳවා ගැනීම නිසා ස්වාභාවික කාලගුණික රටාව අනුව වැවේ ජලය අඩු හෝ වැඩි වීමක් සිදු නොවේ.

රූප සටහන - 18 - හැඩ ඔයේ වම් ඉවුරෙන් එන ඇල මාර්ගය

පහත නිරීක්ෂණය විය.

(අ) මහ වැවෙහි ජලය වර්ෂය පුරාම උපරිම ජල ධාරිතාවයකින් පැවතීම.

හැඩ ඔය ව්‍යාපෘතිය මගින් ලාහුගල ජාතික උද්‍යානයේ පිහිටි මහ වැවේ ජලය වර්ෂය පුරාම උපරිම ධාරිතාවෙන් පැවතීම හේතුවෙන් අක්කර අඩි 2,670 ක් පමණ වූ වැවේ පරිමාවෙන් අක්කර අඩි 2,000 පමණ වූ වැව් පිටිය අහිමි වී ගොස් තිබුණි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීමට පෙර ස්වාභාවික කාලගුණික රටාවට අනුව වර්ෂා කාලයට වැවේ ජලය පිරීම හා නියං කාලයට ජලය අඩු වී වැව් පිටිය විශාල වීමත් සමඟ තෘණ දළුලා වැඩෙන අතර අලීන් ප්‍රිය කරන තෘණ විශේෂයක් වන බෙරු තෘණ වර්ගය සාරවත්ව ව්‍යාප්ත වී තිබුණු බව අනාවරණය විය. මෙම තෘණ වර්ගය වැඩීම සඳහා අඩි 1 ½ පමණ ජලය අවශ්‍ය වේ. ලාහුගල ජාතික උද්‍යානය සංචාරකයින් අතර ප්‍රසිද්ධියට පත්ව ඇත්තේ විශාල අලි රංචු නැරඹිය හැකි ජාතික උද්‍යානයක් ලෙස වුවද වර්තමානයේ මෙම උද්‍යානයට එම තත්ත්වය අහිමි වී ගොස් ඇති බව අනාවරණය විය.

3.5.5.3. වන අලීන් ගම් වැදීම හා අලි මිනිස් ගැටුම් සංඛ්‍යාව වර්ධනය වීම.

වන අලීන්ට ජාතික උද්‍යානය තුළවැව් පිටිය අහිමි වීමත් සමඟ ආහාර සොයා ගම් වැදීම වැඩි වී තිබෙන බවත් පහත දත්ත අනුව නිරීක්ෂණය විය.

(අ) වන අලින්ගෙන් සිදු ව වගා හානි පිලිබඳ විස්තර

වන අලින්ගෙන් සිදු ව වගා හානි පිලිබඳ විස්තර පහත දැක්වේ.

වර්ෂය	හානියට ලක් වූ අවස්ථා සංඛ්‍යාව
2014	01
2015	01
2016	01
2017	-
2018	-
2019	-
2020	87
2021	216
2022 සැප්තැම්බර්	82

(ආ) වන අලීන්ගෙන් සිදු වූ දේපල හානි පිළිබඳ විස්තර

වර්ෂය	හානියට ලක් වූ අවස්ථා සංඛ්‍යාව
2013	02
2014	01
2015	01
2016	-
2017	01
2018	-
2019	10
2020	09
2021	13
2022 සැප්තැම්බර්	11

(ඇ) අලි වෙඩි නිකුත් කිරීම

වර්ෂය	ගිගුම් වෙඩි කුඩා	ගිගුම් වෙඩි ලොකු	සංඥා (සිග්නල්) වෙඩි
2011	-	720	50
2012	-	1525	275
2013	-	3450	630
2014	-	950	400
2015	50	3062	915
2016	450	4825	1475
2017	450	2145	1550
2018	2775	2475	2550
2019	5175	2350	2775
2020	3875	1875	2705
2021	3525	4010	2560
2022 සැප්තැම්බර්	2900	800	1750

ලොකු සහ කුඩා ගිගුම් වෙඩි නිකුත් කරනු ලබන්නේ ගම් වැසියන්ට වන අතර ගබඩාවේ තිබෙන ප්‍රමාණය අනුව ලොකු කුඩා වශයෙන් ගිගුම් වෙඩි දෙකක් එක් වරකදී පුද්ගලයෙකුට නිකුත් කරනු ලබයි. සංඥා වෙඩි ලබා දෙන්නේ වනජීවී නිලධාරීන් හා සිවිල් ආරක්ෂක බලකායෙන් ලබා දී තිබෙන වන අලි පලවා හැරීමේ කණ්ඩායමට පමණි. සාමාන්‍ය සිවිල් ජනයාට සංඥා වෙඩි ලබා නොදේ.

(ඇ) මේ අනුව වන අලි විසින් සිදුකරනු ලබන වගා හානි දේපල හානි හා අලි වෙඩි තිකුත් කිරීම 2011 සිට 2014 කාලසීමාවට වඩා 2019, 2020 වර්ෂවල වර්ධනය වී ඇති බව නිරීක්ෂණය වේ.

(ඉ) **වන අලි මරණ සංඛ්‍යාව**

වර්ෂය	අලි මරණ සංඛ්‍යාව		
2013	05		
2014	11		
2015	18		
2016	13		
2017	17		
2018	15		
2019	12	08	අවුරුදු 20 ට අඩු අලි මරණ හක්කපටස් ආහාරයට ගැනීම නිසා මරණය සිදු වී තිබුණි.
2020	08	03	
2021	04	-	
2022.09.05 දිනට	05	04	

ලාහුගල ජාතික උද්‍යානය තුළ2013 වර්ෂයේ සිට 2022 සැප්තැම්බර් 05 දින දක්වාම අලි මරණ 108 ක් සිදු වී ඇති අතර මෙම මරණ වලින් අවුරුදු 20 ට අඩු අලි මරණ වලට ප්‍රධාන හේතුවක් වී ඇත්තේ මිනිසුන් විසින් දමන හක්ක පටස් කෑමට ගැනීමෙන් බව අනාවරණය වී තිබුණි. මෙසේ අවාසනාවන්ත ලෙස අලි මිය යෑම සිදුවන්නේ ආහාර සොයා ගම් වැදීම හේතුවෙනි.

3.5.5.4. බෙරු තෘණ කෘතිමව සිටුවීම.

ජාතික උද්‍යාන තුළ මහ වැවෙහි බෙරු තෘණ වඳවී යාම නිසා එම තෘණ ව්‍යාප්ත කිරීම සඳහා නියමු ව්‍යාපෘතියක් ලෙස උද්‍යානය තුළතිබෙන කිතුලාන වැව, රවුම්වල තිඹිරියවල යන ස්ථාන කිහිපයක මුලු භූමි ප්‍රමාණය අක්කරයක පමණ බෙරු තෘණ කෘතීමව සිටුවීම සිදුකර තිබුණි. එම තෘණ සාර්ථකව පැල වී තිබෙනු දක්නට ලැබුණු අතර උද්‍යානය තුලට ගාල් කර ඇති හරක් මෙම තෘණ ආහාරයට ගැනීම නිසා වර්ධනය වන තෘණ රැක ගැනීම ගැටළුවක් වී තිබුණි.



රූප සටහන - 19 - බෙරු තෘණ කෘතිමව සිටුවීම

3.5.5.5. මහ වැවෙහි වැව් බැම්ම ඛාදනය වීම.

හැඩ ඔය ව්‍යාපෘතිය යටතේ ඇල මාර්ග මගින් හා පිටවාන උස් කිරීම මගින් වැවේ ජලය පිරවීම හා රඳා පැවැත්ම සිදුකල ද වැව් බැම්ම ශක්තිමත් කිරීම (වැවෙහි රලපනාව) සිදුකර නොතිබීම නිසා වැව් බැම්ම කැඩී ගොස් තිබුණු අතර වැසි සමයේදී වැවට ජලය එකතු වීම වැඩි වීමත් සමග වැව් බැම්ම කැඩී යාමේ තර්ජනයක් පවතින බව නිරීක්ෂණය විය. වැව් බැම්ම කැඩීගොස් ජලය පිටාර යෑමට ලක්වීමෙන් ජතික උද්‍යානයේ පැවැත්මට බාධා එල්ලවිය හැකි අතර එමඟින් පහළ ප්‍රදේශයේ තෘණභූමි වලට ද හානි සිදුවිය හැකි බව නිරීක්ෂණය විය.

රූප සටහන - 20 - ලාහුගල ජාතික උද්‍යානයේ මහ වැවෙහි වැව් බැම්ම

3.5.6. ලුණුගම්වෙහෙර ජාතික උද්‍යානය

3.5.6.1. ලුණුගම්වෙහෙර ජාතික උද්‍යානය නැරඹීමට පැමිණෙන සංචාරකයින් සහ වාර්ෂික ආදායම

2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා උද්‍යානය නැරඹීමට පැමිණි සංචාරකයින් (දේශීය, විදේශීය) සංඛ්‍යාව සහ ආදායම පිළිබඳ විස්තර පහත දැක්වේ. (උද්‍යාන ගාස්තු, වාහන ගාස්තු, සේවා ගාස්තු, බංගලා ගාස්තු, රෙදිපිළි ගාස්තු සහ පරිත්‍යාග ඇතුළත් වීම)

වගු අංක - 12 - ලුණුගම්වෙහෙර ජාතික උද්‍යානය නැරඹීමට පැමිණෙන සංචාරකයින් සහ වාර්ෂික ආදායම

වර්ෂය	සංචාරකයින් සංඛ්‍යාව		ආදායම වැට් රහිත රු.
	දේශීය	විදේශීය	
2017	5,786	3,345	7,489,992
2018	2,893	1,119	3,528,471
2019	2,204	647	2,369,115
2020	1,877	222	1,208,252
2021	1,936	49	817,700



රූප සටහන - 21 - ලුණුගම්වෙහෙර ජාතික උද්‍යානයට සංචාරකයන්ගේ පැමිණීම

(අ) ඉහත ආදායම් වාර්තා අනුව 2019 වර්ෂයට පෙර වර්ෂවලදී සංචාරකයින්ගේ වැඩි වීමක් සහ වැඩි ආදායමක් රජයට ලැබී තිබුණද 2019 වර්ෂයේ සිට වරින් වර පැවති අයහපත් කාලපරිච්ඡේදය හේතුවෙන් ආදායම අඩු වී තිබුණි. 2021 වර්ෂයේදී සියයට 90 කට ආසන්න ප්‍රමාණයක් ආදායමේ අඩුවක් සිදුව තිබුණි. මෙම අහිතකර තත්ත්වයන් අනාගතයේදී ඇතිවීම වලක්වා ගැනීමට සැලසුම් පිළියෙල කිරීමත් ඒවා ක්‍රියාත්මක කිරීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතු බව නිරීක්ෂණය විය. ජාතික උද්‍යානවලින් උපයන ආදායම ඉහළ යාම මඟින් තෘණ භූමි කළමනාකරණය සඳහා අරමුදල් සම්පාදනය කර ගත හැකි අතර එමඟින් සංචාරක ආකර්ෂණය සඳහා වැදගත් වන අලීන්ගේ පැවැත්ම තහවුරු කරගත හැකි වේ.

3.6. තෘණ භූමි කළමනාකරණය සහ සංරක්ෂණය සඳහා වූ මූල්‍ය ප්‍රතිපාදන

ජාතික උද්‍යාන කිහිපයක තෘණ භූමි කළමනාකරණය සඳහා 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා වියදම් දරා ඇති ආකාරය පහත වගු වලින් දක්වා ඇත.

3.6.1. ලාහුගල ජාතික උද්‍යානය

ලාහුගල ජාතික උද්‍යානයේ තෘණ භූමි කළමණාකරණය සඳහා 2018 වර්ෂයේ සිට 2021 දක්වා වර්ෂ 05ක කාල සීමාව තුළ වැය කරන ලද මුදල් ප්‍රමාණය පිළිබඳ තොරතුරු පහත වගුවෙහි දැක්වේ.

වගු අංක - 13 - ලාහුගල ජාතික උද්‍යානයේ තෘණ භූමි කළමනාකරණය සඳහා ප්‍රතිපාදන උපයෝජනය

වර්ෂය	වර්ෂය සඳහා ඉල්ලුම් කල මුදල රු.	වර්ෂය සඳහා ලද මුදල රු.	වර්ෂය සඳහා වැයකල මුදල රු.	වැයකල කාරණය
2017	-	860,262	නැත	
2018	-	-	-	
2019	-	-	-	
2020	-	-	-	
2021	-	477,463	477,487	යටි පඳුරු ඉවත් කිරීම



රූප සටහන - 22 - ලාහුගල ජාතික උද්‍යානයේ තෘණ භූමි සංරක්ෂණය සඳහා ප්‍රතිපාදන ලැබීම්

(අ) ලාහුගල ජාතික උද්‍යානයේ තෘණ භූමි කළමණාකරණය සඳහා 2017 වර්ෂයේ මුදල් ලැබුණද කිසිම කලමණාකරණ කටයුත්තක් සිදුකර නොතිබුණ අතර ඉන් වර්ෂ 03 කට පසුව ලැබුණු මුදල යටි පඳුරු ඉවත් කිරීමට යොදාගෙන තිබුණි. ඉහත ආකාරයට නිසි සැලසුමකට අනුව මුදල් ඉල්ලුම් කිරීම හා මුදල් ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් ජාතික උද්‍යාන තුළ ආක්‍රමණික ශාක පැතිරීම පාලනය කිරීමට නොහැකි බව නිරීක්ෂණය වේ.

3.6.2. මින්නේරිය ජාතික උද්‍යානය

මින්නේරිය ජාතික උද්‍යානයේ තෘණභූමි කළමනාකරණය සඳහා වැය කරන ලද මුදල් ප්‍රමාණය පිළිබඳ තොරතුරු පහත වගුවෙහි දැක්වේ.

වගු අංක - 14 - මින්නේරිය ජාතික උද්‍යානයේ තෘණ භූමි කළමනාකරණය සඳහා ප්‍රතිපාදන උපයෝජනය

වර්ෂය	වර්ෂය සඳහා ලද මුදල රු.	වර්ෂය සඳහා වැයකල මුදල රු.	වැයකල කාරණය
2019	1,510,973	100%	රඹවිල- බටුඔය මාර්ගයේ යටි කැලය ඉවත් කිරීම.
	1,007,315	100%	කිරිඔය පදුපොල මාර්ගයේ යටි කැලය ඉවත් කිරීම.
	1,309,510	100%	මහඔය - ජේක් කුලම මාර්ගයේ යටි කැලය ඉවත් කිරීම.
	1,007,315	100%	අක්කර 100 මාර්ගයේ යටි කැලය ඉවත් කිරීම.
2020	750,450	50%	මහපිටිය ප්‍රදේශයේ යටි කැලය ඉවත් කිරීම.
2021	805,852	100%	තල්කොටේ අක්කර 100 මාර්ගයේ යටි කැලය ඉවත් කිරීම.
	1,510,973	100%	විදුලි රැහැන් මාර්ගයේ යටි කැලය ඉවත් කිරීම.
	1,510,973	100%	ජාතික උද්‍යාන මූලස්ථානය - බටුඔය මාර්ගයේ යටි කැලය ඉවත් කිරීම.
	1,007,315	100%	කිරිඔය - පදුපොල මාර්ගයේ යටි කැලය ඉවත් කිරීම.
	1,309,510	100%	ජේක් කුලම - මහවැව මාර්ගයේ යටි කැලය ඉවත් කිරීම.
	109,515	100%	වැව් පිටිය තුළඅගඩ ශාක ඉවත් කිරීම



රූප සටහන - 23 - මින්නේරිය ජාතික උද්‍යානයේ තෘණ භූමි සංරක්ෂණය සඳහා ලද මුදල

(අ) මින්නේරිය ජාතික උද්‍යානය තුළආක්‍රමණශීලී ශාක පැතිරී ගොස් ඇති ප්‍රදේශ ලෙස වැව්පිටිය, මහපිටිය, වේරපිටිය, උණ පිටිය හා විදුලි රැහැන් මාර්ගය යන ප්‍රදේශ වන අතර තෘණ භූමි කලමණාකරණය සඳහා 2018 වර්ෂයේ සිට 2021 දක්වා වැය කරන ලද මුදල් පිළිබඳව සලකා බැලීමේදී ඉහත ප්‍රදේශවල ආක්‍රමණික ශාක පැතිරීම මර්ධනය කිරීම සඳහා ප්‍රමුඛස්ථානය දී කටයුතු කර නොතිබුණි. එසේම ආක්‍රමණශීලී ශාක පැතිරීම පාලනය කිරීම පිණිස අඛණ්ඩව ඒවා ඉවත් කිරීම සිදුකල යුතු වුවත් ඉහත වියදම් විස්තරය පරික්ෂා කිරීමේදී එසේ කටයුතු කර නොතිබුණි. නිදසුනක් ලෙස මහ පිටිය ප්‍රදේශයේ හෙක්ටයාර් 20ක භූමි ප්‍රමාණයක සියයට 75 ක භූමි ප්‍රමාණය ආක්‍රමණික ශාක පැතිරී ඇති අතර පැතිරීම පාලනය කර ඇතිතේ සියයට 25 භූමි ප්‍රමාණයක් පමණක් වන අතර ඒ සඳහා 2020 වර්ෂයේ රු.750,449 ක් (භෞතික හා මූල්‍ය කාර්ය සාධන සියයට 50) ලෙස දක්වා තිබුණි.

3.6.3. කුමන ජාතික උද්‍යානය

කුමන ජාතික උද්‍යානයේ තෘණ භූමි කළමනාකරණය සඳහා වැය කරන ලද මුදල් ප්‍රමාණය පිළිබඳ තොරතුරු පහත වගුවෙහි දැක්වේ.

වගු අංක - 15 - කුමන ජාතික උද්‍යානයේ තෘණ භූමි කළමනාකරණය සඳහා ප්‍රතිපාදන උපයෝජනය

වර්ෂය	වැය කල මුදල රු.	හෙක්ටයාර් ගණන	වැයකල කාරණය
2017	537,117		මාර්ගය දෙපස යටි කැලය ඉවත් කිරීම.
2018	2,016,187	44Km	මාර්ගය දෙපස යටි කැලය ඉවත් කිරීම.
2019	1,510,973	15Km	මාර්ගය දෙපස යටි කැලය ඉවත් කිරීම.
	3,777,433	75Ha	තෘණ පිටිවල යටි කැලය ඉවත් කිරීම.
2020	9,991,691	30Km	මාර්ගය දෙපස යටි කැලය ඉවත් කිරීම.
	2,452,812	50Km	තෘණ පිටිවල යටි කැලය ඉවත් කිරීම
2021	4,790,020	48Km	මාර්ගය දෙපස යටි කැලය ඉවත් කිරීම.
	4,532,919	90Km	තෘණ පිටිවල යටි කැලය ඉවත් කිරීම



රූප සටහන - 24 - යටි කැලය ඉවත් කිරීම සඳහා වැය කල මුදල

කුමන ජාතික උද්‍යානයේ ආක්‍රමණික ශාක පැතිරී ඇති මුළු තෘණ භූමි ප්‍රමාණය හෙක්ටයාර් 1050 පමණ වන අතර 2019,2020 හා 2021 වර්ෂ සඳහා තෘණ පිටිවල ආක්‍රමණික ශාක ඉවත් කර ඇත්තේ හෙක්ටයාර් 215 ක් පමණි. වැය කර ඇති මුදල රු.10,763,165 කි. විස්තර ඉහත දක්වා ඇත. මේ අනුව තෘණ භූමි කළමණාකරණය සඳහා ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබුණු බව නිරීක්ෂණය වේ.

3.6.4. විල්පත්තු ජාතික උද්‍යානය

විල්පත්තු ජාතික උද්‍යානයේ තෘණ භූමි කළමනාකරණය සඳහා වැය කරන ලද මුදල් ප්‍රමාණය පිළිබඳ තොරතුරු පහත වගුවෙහි දැක්වේ.

වගු අංක - 16 - විල්පත්තු ජාතික උද්‍යානයේ තෘණ භූමි කළමනාකරණය සඳහා ප්‍රතිපාදන උපයෝජනය

වර්ෂය	වැය කල මුදල රු.	භූමි ප්‍රමාණය හෙක්ටයාර්	වැයකල කාරණය
2018	1,012,720	65	ඇත් අතුරු සෙවන හා අලි රඳවා ගන්නා මධ්‍යස්ථානය
2019	1,259,144	25	මහ වැව, කුඩුක් විල, මැණික් විල ප්‍රදේශයන්වල ආක්‍රමණික ශාක ඉවත් කිරීම.
2020	1,000,315	20	තෘණ භූමිවල ආක්‍රමණික ශාක ඉවත් කිරීම.
2021	4,029,216	80	යටිකැලය ඉවත් කර තෘණ භූමි ඇති කිරීම.
	2,014,630	40	තන්තිරිමලේ ප්‍රදේශයේ යටිතලය ඉවත් කර තෘණ භූමි ඇති කිරීම.
	1,007,315	20	කොක්මොටේ පිටිය තෘණ භූමි ඇති කිරීම
	1,510,973	30	පොම්පරිප්පු පිටිය තෘණ භූමි ඇති කිරීම
	755,488	15	කොක්කාරිය පිටිය තෘණ භූමි ඇති කිරීම
	503,657	10	මැණික්විල පිටිය තෘණ භූමි ඇති කිරීම

විල්පත්තු ජාතික උද්‍යානයේ තෘණ භූමි කළමණාකරණය සඳහා මුදල් වැය කර ඇති ආකාරය දෙස බැලීමේදී 2018, 2019, 2020, 2021 වර්ෂයන්වල මුදල් වැයකර තිබුණද නිසි සැලසුමකට අනුව සිදු වී නොතිබුණු බව නිරීක්ෂණය විය.

3.6.5. හොරොව්පතාන ජාතික උද්‍යානය

හොරොව්පතාන ජාතික උද්‍යානයේ තෘණ භූමි කළමනාකරණය සඳහා වැය කරන ලද මුදල් ප්‍රමාණය පිළිබඳ තොරතුරු පහත වගුවෙහි දැක්වේ.

වගු අංක - 17 - හොරොව්පතාන ජාතික උද්‍යානයේ තෘණ භූමි කළමනාකරණය සඳහා ප්‍රතිපාදන උපයෝජනය

වර්ෂය	වර්ෂය සඳහා ඉල්ලුම් කල ප්‍රතිපාදන ප්‍රමාණය (රු.)	වර්ෂය සඳහා ලැබුණු මුදල (රු.)	ඉල්ලුම් කල මුදලින් ලැබුණු මුදල් ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස (%)
2019	3,200,000	146,060	සියයට 05
2020	4,500,000	1,007,315	සියයට 22
2021	3,550,000	2,089,729	සියයට 58



රූප සටහන - 25 - හොරොව්පතාන ජාතික උද්‍යානයේ තෘණ භූමි කළමනාකරණය සඳහා මුදල් ලැබීම්

ඉහත තොරතුරු අනුව 2019 වර්ෂයේ ඉල්ලුම් කල මුදලින් සියයට 5 ක් ද 2020 වර්ෂයේ සියයට 22 ක් ද 2021 වර්ෂයේ සියයට 58 ක් ද වශයෙන් ලැබී තිබුණු අතර නිසි අයුරින් ප්‍රතිපාදන නොලැබීම ආක්‍රමණශීලී ශාක පැතිරීම අඛණ්ඩව පාලනය කිරීමට බාධාවක් වන බව නිරීක්ෂණය විය.

3.6.6. අම්පාර අභය භූමිය හා බුද්ධංගල අභය භූමිය පිළිබඳ වූ නිරීක්ෂණය

අම්පාර අභය භූමියේ තෘණ භූමි පමණක් දළ වශයෙන් හෙක්ටයාර 600 ක් පමණද බුද්ධංගල අභය භූමියේ තෘණ භූමි ප්‍රමාණය දළ වශයෙන් හෙක්ටයාර 500 පමණද පවතින බව වාර්තා විය. අම්පාර අභය භූමියේ තෘණ භක්ෂක සතුන්වන අලි, මුවන්, හාවුන්, ගෝනුන් වැනි සතුන් 100 ට වැඩි ප්‍රමාණයක් වාසය කරන අතර බුද්ධංගල අභය භූමියේ ද මෙම තෘණ භක්ෂක සතුන් 100 ට වැඩි ප්‍රමාණයක් වාසය කරන බව වාර්තා වුවද පසුගිය වසර 05 තුළඑනම් 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා මෙම තෘණ භූමි කළමණාකරණය සඳහා මුදල් ප්‍රතිපාදන වෙන්කර නොතිබුණි.

3.6.7. තෘණ භූමි සංරක්ෂණය සඳහා මූල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම

තෘණ භූමි සංරක්ෂණය සම්බන්ධයෙන් නිසි සැලැස්මක් නොතිබීම, අඛණ්ඩව ප්‍රතිපාදන නොලැබීම, ප්‍රමුඛතාගත කිරීමේදී තෘණ භූමි සංරක්ෂණය කිරීම සම්බන්ධයෙන් වන ප්‍රමුඛතාවය පැහැදිලිව හඳුනා නොගැනීම වැනි හේතුන් ප්‍රතිපාදන ප්‍රමාණත්මකව නොලැබීමට හේතුවිය හැකි බව නිරීක්ෂණය විය. වර්තමානයේ පවතින ආර්ථික අර්බුදය හමුවේ ප්‍රතිපාදන වෙන් නොකිරීම සාධාරණ වුවත් මෙම තත්ත්වයට පෙර රට සාමාන්‍යකරණය වී තිබියදී පවා එසේ සිදුකර නොතිබුණි.

4. නිර්දේශ

4.1 තෘණ භූමි කළමණාකරණය හා සංරක්ෂණය සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්තියක් පිළියෙල කර ක්‍රියාත්මක කිරීම හා ඒ සම්බන්ධයෙන් කළමනාකරණ සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ක්‍රියාත්මක කිරීම හා පසුවිපරම් කිරීම. [ඡේද අංක 3.1.1 / ඡේද අංක 3.1.3]

4.2 ආගන්තුක ආක්‍රමණශීලී ජීවී විශේෂ පාලනය සම්බන්ධයෙන් වූ ජාතික ප්‍රතිපත්තිය හා ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාවට නැංවීම, පසු විපරම් කිරීම හා මූලික අවධියේදීම ආක්‍රමණික ශාක හඳුනා ගැනීම හා ශාක පැතිරීම අඛණ්ඩව පාලනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම හා ඊට අවශ්‍ය මූල්‍ය පහසුකම් ලබා දීම. [ඡේද අංක 3.1.3 (අ), (ආ), (ඇ) / 3.2.3 (අ), (ආ) / (3.3.1 – 3.3.8 දක්වා)]

4.3 පවතින තෘණ භූමි සංරක්ෂණය කිරීමටත් තෘණ භූමි වැඩි දියුණු කිරීමටත් අවශ්‍ය කටයුතු කිරීම හා තෘණ භූමි සංරක්ෂණ ක්‍රියාවලිය සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන නියමිත කාල වලදී ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම. [ඡේද අංක 3.2.3 (ආ)]

4.4 ගෘහස්ථ ගවයන් ජාතික උද්‍යාන තුළ පිහිටි තෘණ භූමි තුළට ඇතුළු වීම පාලනය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම හා ගව සම්පත විධිමත් ක්‍රමවේදයකට ආරක්ෂා කිරීමට පියවර ගැනීම. [ඡේද අංක 3.4.3 - 3.4.5 දක්වා]

4.5 සංචාරකයින් වැඩි වීම ඇතුළු කරුණු මත මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් සිදුවන අහිතකර ක්‍රියාවන් උග්‍ර විය හැකි බැවින් ඒ සම්බන්ධයෙන් වනජීවී දෙපාර්තමේන්තුව විසින් සුදුසු කාලීන පියවර ගැනීමට කටයුතු කල යුතු වීම. [ඡේද අංක 3.5.1]

4.6 වැව් පිටිවල පවතින තෘණ භූමි වල ස්වභාවික පැවැත්මට ඇතිව තිබෙන බාධා අවම කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම හා නව ජල යෝජනා ව්‍යාපෘති සහ වාරිමාර්ග කටයුතු සඳහා ජලය මුදා හැරීමේදී වර්ෂය පුරා වැව් අඛණ්ඩව පිරී පැවතීමෙන් වැව් පිටිවල තෘණ වර්ධනයට බාධා වී තිබෙන බැවින් එවැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී තුලනාත්මකව කටයුතු කිරීම හා ඒ පිළිබඳව වැඩි අවධානයක් යොමු කිරීම. [ඡේද අංක 3.5.2 (i), (ii) / ඡේද අංක 3.5.4 (ඇ) / ඡේද අංක 3.5.5 (ආ) (i)]

4.7 ජාතික උද්‍යාන තුළ පවතින තෘණ භූමි මනා ලෙස කළමනාකරණය හා සංරක්ෂණය නොකිරීම හේතුවෙන් වන අලි ගම් වැදීමට ප්‍රධාන හේතුවක් වන බැවින් තෘණ භූමි නිසි පරිදි කළමනාකරණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. [ඡේද අංක 3.5.5 (ඇ) (ii)]

4.8 ජාතික උද්‍යාන සම්බන්ධයෙන් පාරිසරික තත්ත්වයන් පිළිබඳව දත්ත පද්ධතියක් (මාසික වාර්තා) පවත්වාගෙන යාමට ක්‍රියා මාර්ග ගැනීම. [ඡේද අංක 3.5.5]

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති
2024 මාර්තු 05 දින